“හෙලෝ චිබා”

ハローちば

සිංහල භාෂා ජීවන මාර්ගෝපදේශ පොත

シンハラ語版生活ガイドブック

ප්‍රකාශිත දිනය: 2025 මාර්තු

発行日 :2025 年 4 月

සංස්කරණය සහ ප්‍රකාශනය:

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව,ජාත්‍යන්තර සම්බන්ධතා

අංශය - චිබා ප්‍රාන්තය

編集・発行:

千葉県総合企画部国際課

多言語生活情報「ハローちば」

බහු භාෂා ජීවන තොරතුරු “හෙලෝ චිබා”

目次　　පටුන

1 緊急時のために

緊急時の連絡先

外国人相談窓口

1 හදිසි අවස්ථාවකදී

හදිසි ඇමතුම් අංක 1

විදේශිකයන් සඳහා වන උපදේශන සේවා 4

2 災害対策

防災情報

日ごろの備え

地震が起こったら

台風・大雨

火事

2 ආපදා වැළැක්වීම සඳහා වන පියවර

ආපදා වැළැක්වීම් ආශ්‍රිත තොරතුරු 13

දෛනික සූදානම් වීම් 13

භූමිකම්පාවක් සිදු වූ අවස්ථාවක 15

සුළි කුණාටු / අධික වර්ශාපතනය 17

ගිනි ගැනීම් 18

3 行政手続き

住居地の（変更）届出

マイナンバー制度

結婚をしたとき〔婚姻届〕

離婚をしたとき〔離婚届〕

妊娠したとき〔母子健康手帳〕

子どもが生まれたとき〔出生届〕

子どもを養育するとき〔児童手当〕

亡くなったとき〔死亡届〕

自動車、土地、家を買ったり、権利に係わる契約をするとき〔印鑑登録〕

在留の手続き

税金

3 පරිපාලන ක්‍රියා පටිපාටිය

පදිංචිය (වෙනස් කිරීම) ආශ්‍රිත දැනුම්දීම් 20

තනි පුද්ගල අංක (“මගේ අංකය”) පද්ධතිය 20

විවාහය 〔විවාහ ලියාපදිංචිය〕 21

දික්කසාදය 〔දික්කසාද ලියාපදිංචිය〕 22

ගර්භණීභාවය 〔මාතෘ හා ළමා සෞඛ්‍ය අත්පොත〕 22

දරු උපත් 〔උප්පැන්න ලියාපදිංචිය〕 22

දරුවන් පෝෂණය 〔ළමා දීමනාවන්〕 23

මරණය 〔මරණ සහතික ලියාපදිංචිය〕 23

මෝටර් රථයක්, ඉඩමක්, නිවසක් මිලදී ගැනීමේදී සහ අයිතිවාසිකම් හා සම්බන්ධ කොන්ත්‍රාත්තු අත්සන් තැබීමේදී 〔පෞද්ගලික මුද්‍රා ලියාපදිංචිය〕 24

ජපානයේ නේවාසික ක්‍රියා පටිපාටිය 24

බදු 31

4 健康管理

医療機関

医療保険

介護保険

健診（検診）

母子健康手帳

予防接種

4 සෞඛ්‍ය කළමණාකරණය

වෛද්‍ය මධ්‍යස්ථාන 36

වෛද්‍ය රක්ෂණාවරණය 37

වැඩිහිටි රැකවරණ රක්ෂණාවරණය 39

වෛද්‍ය පරීක්ෂණ 39

මාතෘ හා ළමා සෞඛ්‍ය අත්පොත 39

එන්නත්කරණය 40

5 教育

日本の教育制度
幼稚園・保育所
小学校・中学校
途中入学（編入学）
高等学校
大学・短期大学
日本語教育

6 労働

日本で就労するには
日本で仕事を探すとき
〔公共職業安定所（ハローワーク）〕
労働契約の締結
労働相談
労働保険制度
年金制度（国民年金・厚生年金保険）

7 住まい

家やアパートを借りるとき
電気・ガス・水道
引越し

8 暮らし

日本の祝日
覚えておくと便利なミニ情報
ゴミの処理
ペットを飼うとき
物を買ったり、サービスを受けて、トラブルにあったとき
銀行で口座を開設するとき
公共料金の支払
新聞
テレビ・ラジオ
図書館
観光

5 අධ්‍යාපනය

ජපන් අධ්‍යාපන පද්ධතිය 42
පෙර පාසල් (යෝචිඑන්) සහ ළදරු පාසල් (හොයිකුශො) 43
ප්‍රාථමික පාසල් (ශෝගක්කෝ) සහ ද්විතියික පාසල් (චූගක්කෝ) 43
අතරමැදදී පාසලට ඇතුළත් කර ගැනීම් (වාර මැද බදවා ගැනීම්) 44
උසස් පාසල් (කෝතෝගක්කෝ) 44
විශ්ව විද්‍යාල (දයිගකු) සහ කෙටි කාලීන විශ්ව විද්‍යාල (තන්කි දයිගකු) 46
ජපන් භාෂා අධ්‍යාපනය 47

6 රැකි රක්ෂාව

ජපානයේ රැකියාවක නිරතවීමට නම් 50
ජපානය තුළ රැකියා සෙවීම
〔රජයේ රැකියා ආරක්ෂක කාර්යාලය (හෙලෝ වර්ක්) 〕 50
රැකියා කොන්ත්‍රාත්තු අත්සන් තැබීම 53
රැකියා සඳහා වන උපදේශනය 54
කම්කරු රක්ෂණ පද්ධතිය 56
විශ්‍රාම වැටුප් ක්‍රමය (ජාතික විශ්‍රාම වැටුප්, සුබසාධන විශ්‍රාම වැටුප් රක්ෂණය) 56

7 නිවාස

නිවාස හෝ මහල් නිවාස කුලී පදනම් මත ගැනීම 59
විදුලිය, ගෑස්, ජලය 61
නිවාස මාරු කිරීම 62

8 එදිනෙදා ජීවිතය

ජපානයේ නිවාඩු දින 64
අත්‍යවශ්‍ය තොරතුරු 64
අපද්‍රව්‍ය කලමණාකරණය 65
සුරතල් සතුන් ඇති කිරීම 66
භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමකදී ගැටලුවකට මුහුණ දුන් අවස්ථාවක 67

බැංකු ගිණුමක් විවෘත කිරීම 69
බිල්පත් ගෙවීම් 69
පුවත්පත් 69
රූපවාහිනී සහ ගුවන් විදුලිය 70
පුස්තකාල 70
සංචාර 72

9 通信と郵便

郵便（国内郵便、国際郵便）
宅配便
電話

10交通

交通機関
鉄道
バス
タクシー
自動車の運転
原動機付き自転車（原付バイク）
ペダル付き電動バイク
日本の交通ルール・マナー

11行政機関

東京にある在外公館
県内の市役所、町・村役場
国際交流協会

9 සන්නිවේදන හා තැපැල් සේවා

තැපැල් සේවා (දේශීය හා විදේශීය තැපැල් සේවා).....73
කුරියර් සේවා 74
දුරකතන.....74

10 ප්‍රවාහනය

ප්‍රවාහන පහසුකම්.....77
දුම්රිය 77
බස්.....78
ටැක්සි.....79
වාහන ධාවනය කිරීම.....79
මෝටර් බයිසිකලය.....82
පැඩල් සහිත විදුලි බයිසිකලය 82
ජපානයේ රථවාහන නීති සහ ආචාර ධර්ම.....83

11 පරිපාලන මධ්‍යස්ථාන

ටෝකියෝ විදේශ තානාපති කාර්යාලය.....86
චිබා ප්‍රාන්තයේ පිහිටි නගර සහ ග්‍රාමීය කාර්යාල.....90
ජාත්‍යන්තර හුවමාරු සංගමය.....92

1 緊急時のために | හදිසි අවස්ථාවකදී

■ 緊急時の連絡先

◇交通事故、盗難、暴力行為(警察)

電話　110　　(通話料無料)
言語や聴覚に障害をお持ちの方のために;
*千葉県警察メール 110番:https://chiba110.jp
110番アプリシステム:専用アプリをダウンロード
詳細は警察庁ホームページ参照

*千葉県警察ファックス 110番:0120-110-294
(通話料無料)

①局番なしで 110番にダイヤルすると警察が応対します。
②名前、住所、事故や事件の起きた場所、事故や事件の内容を伝えてください。

■ හදිසි ඇමතුම් අංක

◇රථ වාහන අනතුරු, සොරකම්, ප්‍රචණ්ඩකාරී ක්‍රියා (පොලිස්)

දුරකතන අංකය: 110 (ගාස්තු රහිත)
කථන සහ ශ්‍රවණ ආබාධ සහිත පුද්ගලයන් සඳහා;
* චිබා පොලිස් ස්ථානය විසින් තැපැල් ලිපිනය #110: https://chiba110.jp
110 යෙදුම් පද්ධතිය : අදාල යෙදුම බාගත කරගන්න
වැඩිදුර විස්තර සඳහා කරුණාකර ජාතික පොලිස් ඒජන්සියේ වෙබ් පිටුව බලන්න.
* චිබා පොලිස් ස්ථානය ෆැක්ස් අංකය: 0120-110-294
(ගාස්තු රහිත)

① පොලිසිය සම්බන්ධ කර ගැනීම සඳහා ප්‍රාදේශීය කේතයක් නොමැතිව 110යන දුරකතන අංකය අමතන්න.
② නිලධාරියාට ඔබගේ නම, ලිපිනය, අනතුර හෝ සිදුවීම සිදු වූ ස්ථානය සහ සිදු වී ඇති සිදුවීම වාර්තා කරන්න.

日本語 ජපන් භාෂාව	ローマ字 රෝමානු අක්ෂර	シンハラ語 සිංහල භාෂාව
交通事故です	Kotsu jiko desu.	රිය අනතුරක්.
泥棒です	Dorobo desu.	සොරකමක්.
喧嘩です	Kenka desu.	ගැටුමක්.
場所は(　　)です	Basho wa (　　) desu.	ස්ථානය (　　).
住所は(　　)です	Jusho wa (　　) desu.	ලිපිනය (　　).
名前は(　　)です	Namae wa (　　) desu.	මගේ නම (　　).
電話番号は(　　)です	Denwa bango wa (　　) desu.	මගේ දුරකතන අංකය (　　).

③交通事故などで負傷者がいるときは、救護が優先です。救急車を呼ぶ必要がある場合は、119番に電話して救急車を呼んでください。また、交通事故の相手がいるときは、名前、保険番号、住所、電話番号を聞いておきます。

③ රිය අනතුරකින් හෝ වෙනත් අනතුරකින් තුවාල ලැබූ පුද්ගලයන් සිටින්නේ නම් ප්‍රථමාධාර ලබා දීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. ඔබට ගිලන් රථයක් ගෙන්වා ගැනීමට අවශ්‍ය නම් 119 අංකය අමතන්න. රථ වාහන අනතුරකදී අනතුරට සම්බන්ධ වෙනත් පාර්ශවයක් සිටී නම් ඔවුනගේ නම, රක්ෂණ අංකය, ලිපිනය සහ දුරකතන අංකය ලබා ගැනීමට වග බලා ගන්න.

◇交番

千葉県警察　ホームページ
https://www.police.pref.chiba.jp/
盗難や暴力行為、交通事故などにあったら、まず警察(110番)に連絡するか、近くの交番に連絡してください。交番の警察官は夜間のパトロールなども行い、犯罪の防止に努めています。

◇කෝබන් (ආසන්නතම පොලිස් මුරපල)

චිබා ප්‍රාන්ත පොලිස් මුල් පිටුව
https://www.police.pref.chiba.jp/
සොරකමකදී, ප්‍රචණ්ඩකාරී තත්වයකදී හෝ රථ වාහන අනතුරකදී ඒ බව ප්‍රථමයෙන්ම පොලිසියට (110 යන දුරකතන අංකය වෙත) ඇමතුමක් ලබා දී හෝ ලගම ඇති පොලිස් මුරපල වෙත දැනුම් දීමට කටයුතු කරන්න. පොලිස් මුරපලවල පොලිස් නිළධාරීන් රාත්‍රී මුර සේවයේ යෙදී සිටින බැවින් අපරාධ වැලැක්වීම සඳහා යුහුසුලුව මැදිහත් වේ.

*警察全般について相談したいとき
千葉県警察本部「相談サポートコーナー」
（TEL : 043-227-9110）
祝日を除く、月曜日から金曜日の午前8時30分から午後5時15分まで

*පොලිස් ස්ථානයෙන් යම් උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවක චිබා ප්‍රාන්ත පොලිස් මූලස්ථානය (උපදේශන සේවා මධ්‍යස්ථානය)
（දුරකතන අංකය: 043-227-9110）
සදුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 8:30 - ප.ව. 5:15 (රජයේ නිවාඩු දින හැර)

◇火事、救急車（急病、大けが）

電話： 119 (通話料無料)
局番なしで 119 をダイヤルすると、消防署が対応します。

◇ගිනි ගැනීම්, ගිලන් රථ (හදිසි රෝගතුරවීමකදී, බරපතල අනතුරකදී)

දුරකතන අංකය: 119 (ගාස්තු රහිත)
119වෙත ඇමතුමක් ලබා දී (ප්‍රාදේශීය ක්ෂේත්‍රය අවශ්‍ය නොවේ) ගිනි නිවන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගන්න.

日本語 ජපන් භාෂාව	ローマ字 රෝමානු අක්ෂර	シンハラ語 සිංහල භාෂාව
火事です	Kaji desu	ගින්නක්!
救急車をお願いします	Kyukyusha wo Onegaishimasu	කරුණාකර ගිලන් රථයක් එවන්න.
(　　)が(病気·けが)です *状態を説明します。 *アレルギーなど、必要な情報も伝えます。	(　　) ga (Byouki/Kega) desu	(　　) යන තැනැත්තාට (අසනීපයක්/තුවාල). *ඔවුනගේ තත්වය පැහැදිලි කරන්න. *ආසාත්මිකතා වැනි රෝගියා සම්බන්ධ වැදගත් දේ ඇත්නම් ඒවා දැනුම් දෙන්න.
場所は(　　)です	Basho wa (　　) desu	ස්ථානය (　　).
住所は(　　)です	Jusho wa (　　) desu.	ලිපිනය (　　).
名前は(　　)です	Namae wa (　　) desu	මගේ නම (　　).
電話番号は(　　)です	Denwabango wa (　　) desu	මගේ දුරකතන අංකය (　　).

病気やけがの状態

රෝග සහ තුවාල සිදුවීම් වල විවිධ ආකාරයන්

日本語 ජපන් භාෂාව	ローマ字 රෝමානු අක්ෂර	シンハラ語 සිංහල භාෂාව
出血	Shukketsu	ලේ ගැලීම
骨折	Kossetsu	අස්ථි බිඳීම
火傷	Yakedo	පිළිස්සීම
呼吸困難	Kokyu konnan	හුස්ම ගැනීමේ අපහසුතා
痙攣	Keiren	වලිප්පුව
胸が苦しい	Mune ga kurushii	පපුවේ වේදනාව
高熱	Konetsu	අධික උණ
胃が痛い	I ga itai	බඩේ කැක්කුම
意識不明	Ishiki fumei	සිහිය නැතිවීම

◇緊急で医療を受けるための準備

①緊急時に相談できる医者を作っておくと、病院を紹介してもらったり、予約をしてもらえます。

②千葉県の救命救急センターと救急医療体制の情報を知っておいてください。

③緊急時の支払いに備えてマイナンバーカードと現金20,000円ぐらいは用意しておくことが必要です。

④かかりつけの病院がある場合、診察券も用意しておきます。

* 救急医療問診表（日本語・英語・中国語・韓国語・スペイン語・タイ語・ポルトガル語・タガログ語・ペルシャ語）
https://www.qq.pref.chiba.lg.jp/pb_medicalchecklist

◇千葉県内の夜間・休日急病診療所

夜間・休日診察の医療機関は、市町村の広報紙などに掲載されています。

また、「ちば救急医療ネット」で調べることができます。日本語対応のみ医療機関も含まれます。詳しくは、千葉県外国人相談にお問い合わせください (TEL : 043-297-2966)。

・ちば救急医療ネット（日本語のみ）
https://www.qq.pref.chiba.lg.jp/

◇ හදිසි අවස්ථාවකදී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වන පෙර සූදානම

① හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය වේලාවක සම්බන්ධ කර ගත හැකි වෛද්‍යවරයෙකු සූදානම් කර තැබූ විට, ඔබව රෝහලකට යොමු කිරීමක් හෝ ඔබ වෙනුවෙන් වේලාවක් වෙන් කරවා ගැනීම සිදු කරගත හැකිය.

② විබා ප්‍රාන්තයේ හදිසි වෛද්‍ය සත්කාර මධ්‍යස්ථාන සහ හදිසි වෛද්‍ය සේවා පද්ධති පිළිබඳ තොරතුරු සොයා ඒ පිළිබඳව දැනුවත් වී සිටින්න.

③හදිසි අවස්ථාවක ගෙවීම් සඳහා ඔබේ මයි නම්බර් කාඩ්පත (“මගේ අනන්‍යතා අංකය”) සහ මුදල් ලෙස දල වශයෙන් ජපන් යෙන් 20,000ක මුදලක් සූදානම් කර තබා ගන්න.

④ඔබ ප්‍රාථමික ප්‍රතිකාර සඳහා භාවිතා කරන රෝහලක් (පවුලේ රෝහල) ඔබට තිබේ නම්, රෝගීන් ලියාපදිංචි කිරීමේ කාඩ්පත සූදානම් කර තබා ගැනීමටද වග බලා ගන්න.

* හදිසි වෛද්‍ය ප්‍රශ්නාවලිය (ජපන් භාෂාව, ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, තායි භාෂාව, පෘතුගීසි භාෂාව, තග්ලොග් භාෂාව, පර්සියානු භාෂාව)
https://www.qq.pref.chiba.lg.jp/pb_medicalchecklist

◇රාත්‍රියේ සහ නිවාඩු දිනවල විවෘතව පවතින විබා ප්‍රාන්තයේ හදිසි ප්‍රතිකාර මධ්‍යස්ථාන

රාත්‍රී සහ නිවාඩු දිනයන්හි ප්‍රතිකාර ලබාගත හැකි වෛද්‍ය මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු ඔබේ නගර සභාවේ ප්‍රචාරණ පත්‍රිකාවල සඳහන් කර ඇත.
"විබා හදිසි වෛද්‍ය ජාලය" භාවිතයෙන් ද ඔබට එය සොයා ගැනීමට හැකිය. ජපන් භාෂාවෙන් පමණක් සේවාවන් සපයන වෛද්‍ය මධ්‍යස්ථාන ද මෙම ලැයිස්තුවට ඇතුළත් වේ. වැඩි විස්තර සඳහා කරුණාකර විබා විදේශික උපදේශන සේවාව අමතන්න (දුරකථන: 043-297-2966).

- විබා හදිසි වෛද්‍ය ජාලය (ජපන් භාෂාව පමණි)
https://www.qq.pref.chiba.lg.jp/

■ 外国人相談窓口

■විදේශිකයින් සඳහා උපදේශන සේවා

外国人相談一覧

විදේශිකයන් සඳහා උපදේශන සේවා ලැයිස්තුව

実施機関名 මධ්‍යස්ථානයේ නම	電話 දුරකතන අංකය	住所 ලිපිනය	言語 භාෂා	実施日 දිනයන්	時間 වේලාවන්
(公財)ちば国際コンベンションビューロー・千葉県国際交流センター (Chiba Convention Bureau and International Center)	043-297-2966	〒261-8501 Chiba-shi Mihama-ku Nakase 1-3 Makuhari Techno Garden D 14F	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, ස්පාඤ්ඤභාෂාව, තගලොග් ෂාව, වියට්නාම භාෂාව, කොරියන් භාෂාව නේපාල භාෂාව, තායි භාෂාව, පෘතුගීසි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, රුසියන් භාෂාව, හින්දි භාෂාව	සඳුදා - සිකුරාදා	පෙ.ව. 9:00 - ප.ව. 12:00 ප.ව. 1:00 - ප.ව. 4:00
(公財)千葉市国際交流協会 (Chiba City International Association)	043-306-1034	〒260-0013 Chiba-shi Chuo-ku Chuo 3-3-1 Fujimoto Daiichi Seimei Bldg. 2F	ඉංග්‍රීසි භාෂාව	සඳුදා, සිකුරාදා	පෙ.ව. 9:00 - ප.ව. 3:30
				බදාදා, බ්‍රහස්පතින්දා, සෙනසුරාදා	පෙ.ව. 9:00 - ප.ව. 4:30
				අඟහරුවාදා	පෙ.ව. 9:00 - ප.ව. 7:30
			චීන භාෂාව	සඳුදා, අඟහරුවාදා, බ්‍රහස්පතින්දා	පෙ.ව. 9:00 - ප.ව. 7:30
				බදාදා,සිකුරාදා	ප.ව. 2:00 - ප.ව. 7:30
				සෙනසුරාදා	පෙ.ව. 9:00 - ප.ව. 3:30
			කොරියානු භාෂාව	බදාදා,සිකුරාදා	ප.ව. 2:00 - ප.ව. 7:30
				සෙනසුරාදා	පෙ.ව. 9:00 - ප.ව. 3:30
			ස්පාඤ්ඤ භාෂාව	සඳුදා, බ්‍රහස්පතින්දා	ප.ව. 2:00 - ප.ව. 7:30
				සෙනසුරාදා	පෙ.ව. 10:00 - ප.ව. 4:30
			වියට්නාම භාෂාව	සඳුදා,බ්‍රහස්පතින්දා,සිකුරාදා	පෙ.ව. 10:00 - ප.ව. 4:30
			යුක්‍රේනියානු භාෂාව	අඟහරුවාදා, බදාදා, කුරාදා	පෙ.ව.10:00 - ප.ව. 3:30

実施機関名 මධ්‍යස්ථානයේ නම	電話 දුරකතන අංකය	住所 ලිපිනය	言語 භාෂා	実施日 දිනයන්	時間 වේලාවන්
八千代市 (Yachiyo City)	047-487-6310	〒276-0027 Yachiyo-shi Murakamidanchi 2-9-103	ඉංග්‍රීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, පෘතුගීසි භාෂාව	සඳුදා - සෙනසුරාදා	පෙ.ව. 9:00 - ප.ව. 5:00 භාෂා පරිවර්තකයන් ලබා ගත හැකි වන්නේ ප.ව 1:00 සිට ප.ව. 4:00 දක්වා වේ.
市川市 (Ichikawa City)	047-712-8675	〒272-8501 Ichikawa-shi Yawata 1-1-1	ඉංග්‍රීසි භාෂාව චීන භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, කොරියානු භාෂාව, පෘතුගීසි භාෂාව, තග්ලොග් භාෂාව, වියට්නාම භාෂාව, තායි භාෂාව, රුසියන් භාෂාව, ප්‍රංශ භාෂාව, නේපාල භාෂාව, හින්දි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, බර්මර් භාෂාව, බුරුම භාෂාව යුක්‍රේනියානු භාෂාව, මැලේ භාෂාව, මොන්ගෝලියානු, සිංහල, උර්දු, බෙංගාලි, අරාබි මොන්ගෝලියානු සිංහල උර්දු බෙංගාලි අරාබි	සඳුදා - සිකුරාදා	පෙ.ව.10:00 - ප.ව. 5:00
	047-712-8675	〒272-0192 Ichikawa-shi Suehiro 1-1-31		සඳුදා - සිකුරාදා	පෙ.ව 10:00 - ප.ව. 5:00

実施機関名 මධ්‍යස්ථානයේ නම	電話 දුරකතන අංකය	住所 ලිපිනය	言語 භාෂා	実施日 දිනයන්	時間 වේලාවන්
船橋市 (Funabashi City)	050-3101-3495	〒273-8501 Funabashi-shi Minato-cho 2-10-25	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, වියට්නාම භාෂාව, නේපාල භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, තග්ලොග් භාෂාව, තායි භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, හින්දි භාෂාව	සඳුදා - සිකුරාදා	පෙ.ව. 9:00 - ප.ව.5:00
浦安市 (Urayasu City)	047-712-6910	〒279-8501 Urayasu-shi Nekozane 1-1-1	ඉංග්‍රීසි භාෂාව	සඳුදා - සිකුරාදා	පෙ.ව. 10:00 – ප.ව. 12:00 ප.ව. 1:00 – ප.ව. 4:00
			චීන භාෂාව	සඳුදා, අඟහරුවාදා	
			වෙනත් භාෂා (පරිවර්තකය)	සඳුදා - සිකුරාදා	
松戸市 (Matsudo City)	047-366-9151	〒271-8588 Matsudo-shi Nemoto 387-5	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, රුසියානු, ඉන්දුනීසියානු, හින්දි	සඳුදා - සිකුරාදා	පෙ.ව. 8:30 – ප.ව. 4:30
			වියට්නාම, නේපාල, තායි භාෂාව, ප්‍රංශ භාෂාව, ටැග්ලොග්	සඳුදා - සිකුරාදා	පෙ.ව 9:00 - ප.ව. 4:30
流山市 (Nagareyama City)	04-7128-6007	〒270-0111 Nagareyama-shi Edogawadai-Higashi 1-4 (JA Nagareyama-shi Bldg. 3F)	ඉංග්‍රීසි භාෂාව	සඳුදා, බදාදා, සිකුරාදා	පෙ.ව. 10:00 - ප.ව. 12:00 ප.ව. 1:00 - ප.ව. 4:00

実施機関名 මධ්‍යස්ථානයේ නම	電話 දුරකතන අංකය	住所 ලිපිනය	言語 භාෂා	実施日 දිනයන්	時間 වේලාවන්
鎌ケ谷市 (Kamagaya City)	047-442-1850	〒273-0101 Kamagaya-shi Tomioka 1-1-3	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, ටගාලොග් භාෂාව	අව්ධිමත්	පෙ.ව. 10:00 –ප.ව. 4:00
柏市 (Kashiwa City)	04-7168-1033	〒277-8505 Kashiwa-shi Kashiwa 5-10-1	ඉංග්‍රීසි භාෂාව	බ්‍රහස්පතින්දා	ප.ව.1:00 - ප.ව. 5:00
			චීන භාෂාව	බදාදා, සිකුරාදා	
			ස්පාඤ්ඤ භාෂාව	සඳුදා	
			කොරියානු භාෂාව	අඟහරුවාදා (2වෙනි සහ 4වෙනි අඟහරුවාදා පමණි)	
我孫子市 (Abiko City)	04-7183-1231	〒270-1166 Abiko-shi Abiko 4-11-1 Abiko Shimin Plaza	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, කොරියන් භාෂාව, තායි භාෂාව, ප්‍රංශ භාෂාව	දිනපතා (බ්‍රහස්පතින්දා හැර)	පෙ.ව 10:00 – ප.ව. 5:00
成田市 (Narita City)	0476-20-1507	〒286-8585 Narita-shi Hanazaki-cho 760	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියන් භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, තායි භාෂාව, වියට්නාම භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, තග්ලොග් භාෂාව, නේපාල භාෂාව, හින්දි භාෂාව, මැලේ, මියන්මාර භාෂාව	සඳුදා - සිකුරාදා	පෙ.ව 9:00 - ප.ව 5:00
			රුසියානු, ප්‍රංශ	සඳුදා - සිකුරාදා	පෙ.ව 10:00 - ප.ව 5:00

実施機関名 මධ්‍යස්ථානයේ නම	電話 දුරකතන අංකය	住所 ලිපිනය	言語 භාෂා	実施日 දිනයන්	時間 වේලාවන්
佐倉市 (Sakura City)	043-484-6326	〒285-0025 Sakura-shi Kaburagi- machi198-2 Rainbow Plaza Sakura	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, දාරි භාෂාව	සඳුදා - සිකුරාදා (වේලාවක් වෙන් කරවා ගැනීම අවශ්‍ය වේ.)	පෙ.ව10:00 - ප.ව 12:00 ප.ව 1:00 - ප.ව 4:00
四街道市 (Yotsukaido City)	043-312-6173	〒284-0003 Yotsukaido-shi Shikawatashi 2001-10	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව	සඳුදා, බදාදා,සිකුරාදා	පෙ.ව10:00 - ප.ව 3:00
印西市 （Inzai City）	0476-33-4068	〒270-1396 Inzai-shi Omori 2364-2	ජපන් භාෂාව	දෙවනි සිකුරාදා (වේලාවක් වෙන් කරවා ගැනීම අවශ්‍ය වේ.)	පෙ.ව 9:00 - ප.ව 4:00
白井市 (Shiroi City)	047-401-5998	〒270-1492 Shiroi-shi Fuku 112	ඉංග්‍රීසි භාෂාව වෙනත් භාෂා (යන්ත්‍ර පරිවර්තනය)	සඳුදා - සිකුරාදා	පෙ.ව 8:30 - ප.ව 5:15
富里市 (Tomisato City)	0476-93-1117	〒286-0292 Tomisato-shi Nanae 652-1	ඉංග්‍රීසි භාෂාව ටගාලොග් භාෂාව	සඳුදා - සිකුරාදා	පෙ.ව 9:00 - ප.ව 5:00

実施機関名 මධ්‍යස්ථානයේ නම	電話 දුරකතන අංකය	住所 ලිපිනය	言語 භාෂා	実施日 දිනයන්	時間 වේලාවන්
東金市 (Togane City)	0475-50-1114	〒283-8511 Togane-shi Higashiiwasaki 1-1	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, පෘතුගීසි භාෂාව, ටගාලොග් භාෂාව, වියට්නාම භාෂාව, නේපාල භාෂාව	සදුදා - සිකුරාදා	පෙ.ව 8:30 - ප.ව 5:15
			තායි භාෂාව, හින්දි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, බුරුම භාෂාව, මැලේ භාෂාව	සදුදා - සිකුරාදා	පෙ.ව 9:00 - ප.ව 5:15
			ප්‍රංශ භාෂාව, රුසියානු භාෂාව	සදුදා - සිකුරාදා	පෙ.ව 10:00 - ප.ව 5:15
			යුක්‌රේනියානු භාෂාව	(වේලාවක් වෙන් කරවා ගැනීම අවශ්‍ය වේ.)	
茂原市 (Mobara City)	0475-20-1651	〒297-8511 Mobara-shi Dohyo 1	ඉංග්‍රීසි භාෂාව වෙනත් භාෂා (යන්ත්‍ර පරිවර්තනය)	සදුදා - සිකුරාදා	පෙ.ව 8:30 - ප.ව 5:15
鴨川市 (Kamogawa City)	04-7093-5931	〒296-8601 Kamogawa-shi Yokosuka 1450	ඉංග්‍රීසි භාෂාව, තග්ලොග් භාෂාව, වෙනත් භාෂා (යන්ත්‍ර පරිවර්තනය)	සදුදා - සිකුරාදා	පෙ.ව8:30 - ප.ව 12:00 ප.ව 1:00 - ප.ව 4:30

実施機関名 මධ්‍යස්ථානයේ නම	電話 දුරකතන අංකය	住所 ලිපිනය	言語 භාෂා	実施日 දිනයන්	時間 වේලාවන්
君津市 （Kimitsu City）	0439-54-9877	〒299-1152 Kimitsu-shi Kubo 2-11-21	ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියන් භාෂාව, තග්ලොග් භාෂාව	අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා (වේලාවක් වෙන් කරවා ගැනීම අවශ්‍ය වේ.) *පැමිණීම අත්‍යවශ්‍ය වේ.	පෙ.ව. 9:00 - ප.ව 4:00
市原市 (Ichihara City)	0436-23-9866 0436-24-3934	〒290-8501 Ichihara-shi Kokubunjidai Chuo 1-1-1 〒290-0081 Ichihara-shi Goichuonishi 1-1-25 Sunplaza Ichihara 2F	ඉංග්‍රීසි භාෂාව	අඟහරුවාදා, සිකුරාදා	පෙ.ව 9:30 - ප.ව 12:00 ප.ව 1:00 - ප.ව 3:30
			ස්පාඤ්ඤ භාෂාව	සිකුරාදා (පලවෙනි හා තුන්වෙනි සිකුරාදා පමණි)	ප.ව1:00 - ප.ව 4:00
			පෘතුගීසි භාෂාව	බදාදා (පලවෙනි සහ තුන්වන බදාදා පමණි)	පෙ.ව 9:00 - ප.ව 12:00

◇法テラス多言語情報提供サービス

借金、離婚、労働、事故など、通訳を介して日本の法制度や弁護士会など関係機関を紹介します。

電話相談

電話:0570-078377

*通訳を交えて、3者（相談者、職員、通訳）間で話すことができます。

対応言語:英語、中国語、ポルトガル語、スペイン語、韓国語、ベトナム語、タガログ語、ネパール語、タイ語、インドネシア語

受付:月曜日～金曜日午前9:00～午後5:00

◇හෝතෙරසු බහු භාෂා තොරතුරු සැපයීමේ සේවාව

ජපන් භාෂාව කතා කළ නොහැකි විදේශීය ජාතිකයන්ගේ ණය පහසුකම්, දික්කසාද, රැකියා, රිය අනතුරු වැනි අවස්ථාවන් වල ඇති වන ගැටලු වලදී භාෂා පරිවර්තන සේවාවන් සපයනු ලැබේ. ජපානයේ ඒ හා සම්බන්ධ තොරතුරු, නීති පද්ධතිය සහ නීතීඥ සංගම් වැනි ඊට සම්බන්ධ සංවිධාන පිලිබඳව විශේෂිත උපදේශනයන් ලබා දෙයි.

දුරකතන මාර්ගයෙන් සිදු කරන උපදේශන සේවා

දුරකතන : 0570-078377

*පාර්ශව 3ක් (උපදේශනවරයෙකු, ආයතන නිලධාරියෙකු හා භාෂා පරිවර්තකයෙකු) සමග කතා බහ කිරීම.

භාෂා සේවාව : ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, කොරියන් භාෂාව, වියට්නාම භාෂාව, තග්ලොග් භාෂාව, නේපාල භාෂාව, තායි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව

රාජකාරී වේලාවන් : සඳුදා - සිකුරාදා පෙ.ව 9:00 - ප.ව. 5:00

・法テラス千葉
電話： 050-3383-5381
住所：千葉市中央区中央4-5-1
Qiball（きぼーる）2階
・法テラス松戸
電話： 050-3383-5388
住所：松戸市松戸1879-1
松戸商工会議所会館3階
http://www.houterasu.or.jp/

◇外国人のための人権相談（法務省）

・外国語人権相談ダイヤル
電話：0570-090911
英語、中国語、韓国語、タガログ語、ポルトガル語、ベトナム語、ネパール語、スペイン語、インドネシア語、タイ語
月～金 午前9:00～午後5:00

・外国語インターネット人権相談受付窓口
多言語でのインターネット人権相談受付窓口を設置しています。
全国どこからでも人権相談を受けることができます。
https://www.moj.go.jp/JINKEN/jinken21.html#01

◇外国人結核電話相談
（公益財団法人結核予防会）

電話：03-3292-1218・1219
FAX: 03-3292-1290
英語、韓国語（予約制）、中国語、ベトナム語、ミャンマー語（午前中のみ）、ネパール語（第2、第4火曜日の午前中のみ）
毎週火曜日 （午前）10:00～12:00、
（午後） 1:00～3:00
FAX は常時、受け付けています。

◇外国語による DV相談
（女性サポートセンター）
電話：043-206-8002
英語、中国語、韓国語、タガログ語
*予約制

・හෝතෙරසු විබා
දුරකතන: 050-3383-5381
ලිපිනය: Qiball 2F, 4-5-1,Chuo,Chuo-ku,Chiba-shi,Chiba

・හෝතෙරසු මත්සුදෝ
දුරකතන : 050-3383-5388
ලිපිනය : 1879-1 Matsudo, Matsudo-shi, Matsudo
Chamber of Commerce & Industry Hall 3F
http://www.houterasu.or.jp/

◇ විදේශීකයන් සඳහා වන මානව හිමිකම් උපදේශනය
(අධිකරණ අමාත්‍යාංශය)

・විදේශිය භාෂා මානව හිමිකම් හදිසි ඇමතුම් අංකය
දුරකතන: 0570-090911
ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියන් භාෂාව, තග්ලොග් භාෂාව, පෘතුගීසි භාෂාව, වියට්නාම භාෂාව, නේපාල භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, ඉන්දුනීසියන් භාෂාව, තායි භාෂාව
සදුදා - සිකුරාදා පෙ.ව 9:00 - ප.ව 5:00

・විදේශ භාෂා අන්තර්ජාල මානව හිමිකම් උපදේශන සේවාව
ජපානයේ ඕනෑම ස්ථානයක සිට අන්තර්ජාලය ඔස්සේ විදේශ භාෂා මානව හිමිකම් උපදේශන සේවාව ලබා ගත හැකිය.

https://www.moj.go.jp/JINKEN/jinken21.html#01

◇ විදේශීය ජාතිකයන් සඳහා වන ක්ෂය රෝග දුරකථන උපදේශන සේවාව
(ක්ෂය රෝග මර්දන සංගමය)
දුරකතන: 03-3292-1218/1219
ඉංග්‍රීසි භාෂාව, කොරියාන් භාෂාව (කලින් වෙන්කරවා ගැනීම අවශ්‍යයි), චීන භාෂාව, වියට්නාම භාෂාව, බුරුම භාෂාව (උදෑසන පමණි), නේපාල භාෂාව (2 වන සහ 4 වන අඟහරුවාදා උදෑසන පමණි)
සෑම අඟහරුවාදාවකම පෙ.ව 10:00 - ප.ව 12:00,
ප.ව 1:00 - ප.ව 3:00
ෆැක්ස් ඕනෑම අවස්ථාවක පිළිගනු ලැබේ.

◇ විදේශ භාෂාවලින් DV උපදේශනය
(කාන්තා උපකාරක මධ්‍යස්ථානය)
දුරකතන: 043-206-8002
ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, තග්ලොග් භාෂාව
*කලින් වෙන්කරවා ගත යුතුයි.

*女性専用です。
*24時間、365日受け付けていますが、外国語での相談は来所のみです。

* කාන්තාවන් සඳහා පමණි.
* දවසේ පැය 24ම සහ අවුරුද්දේ දින 365ම විවෘතව පවතියි.
නමුත්,විදේශ භාෂා උපදේශනය ලබා ගත හැකි වනුයේ මධ්‍යස්ථානයට පැමිණෙන අයට පමණි.

◇子ども・若者の悩みの相談
（ライトハウスちば）
電話：043-420-8066
英語、中国語
*外国語で相談できる日は、下記URL でご覧になれます。
https://lighthouse.pref.chiba.lg.jp/tel

◇දරුවන් සහ තරුණයන්ගේ ගැටළු සඳහා උපදේශනය
ලයිට්හවුස් චිබා
දුරකතන: 043-420-8066
ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව
* විදේශීය භාෂාවලින් උපදේශන ලබා ගත හැකි දින පහත **URL** එකෙන් බලන්න.
https://lighthouse.pref.chiba.lg.jp/tel

◇ファミリーセンター・ヴィオラ
外国語による福祉相談
電話：0438-53-3453
ベトナム語、タイ語

◇**Viola** පවුල් මධ්‍යස්ථානය
විදේශ භාෂා සුභ සාධන උපදේශනය
දුරකථන: 0438-53-3453
වියට්නාම භාෂාව, තායි භාෂාව

◇日本語の話せる人は下記に相談してください。（千葉県）
・交通事故相談　電話：043-223-2264
・法律相談　電話：043-223-2249,2250
（予約制）
・医療相談　電話：043-223-3636
・救急安心電話相談　電話：#7119　または　03-6810-1636
（月～土曜日　午後6時～翌午前8時
日曜日・祝日　午前9時～翌午前8時）
・こども急病電話相談　電話：#8000または　043-242-9939
（午後7時～翌午前8時）

◇ ඔබට ජපන් භාෂාව කතා කළ හැකි නම් කරුණාකර පහත සංවිධාන සමඟ සාකච්ඡා කරන්න. (චිබා ප්‍රාන්තය)
▪ රථවාහන අනතුරු උපදේශන　දුරකතනය: 043-223-2264
▪ නීති උපදේශන　දුරකතන: 043-223-2249, 2250
(කලින් වෙන් කරවා ගත යුතුය)
▪ වෛද්‍ය උපදේශන　දුරකතනය: 043-223-3636
▪ හදිසි ආධාර දුරකතන උපදේශනය　දුරකතනය: #7119 හෝ 03-6810-1636
(සඳුදා සිට සෙනසුරාදා දක්වා ප:ව 6:00 සිට පසු දින පෙ:ව 8 දක්වා
ඉරිදා/නිවාඩු:ව 9:00 සිට පසු දින පෙ:ව 8 දක්වා)
▪ දරුවන්ගේ හදිසි අසනීප සඳහා වන දුරකතන උපදේශනය
දුරකතනය: #8000 හෝ 043-242-9939
(ව 7:00 සිට පසු දින පෙ:ව 8 දක්වා)

■ 防災情報

◇千葉県防災ポータルサイト

次の情報を提供しています。一部のページについては、英語・ハングル・中国語・スペイン語・ポルトガル語で表記しています。

・県内の地震・津波・台風等の情報
・避難指示情報、 避難所開設
・被害情報などの緊急・災害情報
・天気予報等の気象情報
・鉄道・道路等の交通運行情報
・電気・水道等のライフラインに関する情報

http://www.bousai.pref.chiba.lg.jp/

◇外国人旅行者向けプッシュ型情報発信アプリ「Safety tips」

このアプリケーションは、緊急地震速報と津波警報のほか、災害時に役立つ便利な機能を多言語で提供しています。

・ダウンロード URL

〔Android〕

https://play.google.com/store/apps/details?id=jp.co.rcsc.safetyTips.android

〔iPhone〕

https://itunes.apple.com/jp/app/safety-tips/id858357174?mt=8

◇NHK WORLD –JAPAN

災害が発生したときに、多言語の緊急ニュースをプッシュ通知で受け取ることができます。

https://www3.nhk.or.jp/nhkworld/ja/app/

■ 日ごろの備え

◇備蓄品の準備

災害発生時には、電気・ガス・水道などのライフラインや、物の流れがストップすることがあります。そのような場面に備えて、最低3日分、できれば1週間分の食料品や日用品を備蓄しましょう。

備蓄には、日ごろの食料品を多めに買い置きし、古いものから順に使い、使った分を補充していく「ローリングストック」という方法があります。

比較的無理なく長期の備蓄が準備でき、さらにカセットコンロがあれば、普段通りの温かい食事をとることもできます。

■ ආපදා වැළැක්වීම ආශ්‍රිත තොරතුරු

◇චිබා ප්‍රාන්තයේ ආපදා වැළැක්වීමේ වෙබ් අඩවිය

මෙම වෙබ් අඩවිය මගින් පහත තොරතුරු සපයයි. ඇතැම් වෙබ් පිටු ඉංග්‍රීසි භාෂාව, කොරියානු භාෂාව, චීන භාෂාව, ස්පාඤ්ඤ භාෂාව සහ පෘතුගීසි භාෂාවෙන් ලබා ගත හැකිය.

・චිබා ප්‍රාන්තයේ භූමිකම්පා, සුනාමි, සුලි සුලං ආදිය පිළිබඳ තොරතුරු.
・ආපදා අවස්ථාවක ඉවත් වීමේ දිශාවන් සහ නවාතැන් පිළිබඳ තොරතුරු.
・හානි පිළිබඳ තොරතුරු වැනි හදිසි සහ ආපදා තොරතුරු.
・කාලගුණ වාර්තා ඇතුළු කාලගුණ තොරතුරු.
・දුම්රිය සහ මහා මාර්ග වැනි පොදු ප්‍රවාහනය පිළිබඳ තොරතුරු.
・විදුලිය සහ ජලය ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් පිළිබඳ තොරතුරු.

http://www.bousai.pref.chiba.lg.jp/

◇ “ආරක්ෂිත ඉඟි (Safety Tips)” විදේශීය සංචාරකයන් සඳහා වන push-type තොරතුරු ඇඟවීම් යෙදුමකි.

මෙම යෙදවුම මගින් භූමි කම්පා සහ සුනාමි පිලිබඳ පූර්ව දැනුම් දීම් සහ හදිසි ආපදාවන්හිදී ප්‍රයෝජනවත් වන අත්‍යවශ්‍ය තොරතුරු විවිධ භාෂා වලින් ලබා දේ.

・බාගත කරගත හැකි සබැඳිය

〔ඇන්ඩ්‍රොයිඩ් මෙහෙයුම් පද්ධති සඳහා (Android)〕

https://play.google.com/store/apps/details?id=jp.co.rcsc.safetyTips.android

〔අයි ෆෝන් මෙහෙයුම් පද්ධති සඳහ (iPhone)〕

https://itunes.apple.com/jp/app/safety-tips/id858357174?mt=8

◇NHK WORLD – ජපානය

හදිසි ආපදාවක් සිදු වූ විට භාෂා කිහිපයකින් හදිසි තොරතුරු ලබා ගත හැක.

https://www3.nhk.or.jp/nhkworld/ja/app/

■ දෛනික සූදානම් වීම්

◇ ආහාර තොග ගබඩා කර තබා ගැනීම.

ආපදාවක් ඇති වූ විට, ප්‍රජා සම්ප්‍රදාය සේවා වන විදුලිය, ගෑස් සහ ජලය මෙන්ම භාණ්ඩ ප්‍රවාහයද නතර විය හැකිය. එවැනි සිදුවීමක් සඳහා සූදානම් වීමේදී, අවම වශයෙන් දින තුනකටවත් ප්‍රමාණවත් වන සහ හැකි නම්, සතියකට පමණ සරිලන ආහාර ද්‍රව්‍ය සහ දෛනික අවශ්‍යතා සඳහා වන ද්‍රව්‍ය ගබඩා කර ගන්න. ආහාර ගබඩා කිරීම සඳහා, දෛනික භාවිතය සඳහා අමතර ආහාර ද්‍රව්‍ය මිලදී ගෙන තබාගෙන, පැරණි ආහාර ද්‍රව්‍ය පළමුව භාවිතා කර භාවිතා කළ ද්‍රව්‍ය නැවත පිරවීම හෙවත් "රෝලිං ස්ටොක්" නම් ක්‍රමයක් පවතී. සාපේක්ෂව වෙහෙසකින් තොරව දිගු කාලීනව තොග සකස් කරගත හැකි අතර, ඔබට කැසට් උදුනක් ඇත්නම් සුපුරුදු පරිදි උණුසුම්ව ආහාර ලබා ගත හැක.

〔備蓄品の例〕
- 水(1人1日3リットル、1週間分程度)、カセットコンロ、カセットボンベ、食料(米、カップ麺、レトルト食品、菓子など)
- 携帯型ラジオ、簡易トイレ、携帯電話のバッテリー、懐中電灯、ゴミ袋
- 必要な常備薬、生理用品、粉ミルク、オムツなど

〔非常持出品の例〕
□水、□非常食、□携帯電話のバッテリー、□懐中電灯、□ヘルメット、防災ずきん、□常備薬、□現金、□通帳、印鑑、□タオル、□着替え、□マスク、□雨具、□ティッシュペーパー、
□ライター、ろうそく、□ゴミ袋など

〔ආහාර තොග වලට නිදසුන් ලෙස〕
•වතුර (ලීටර් 3ක් එක් පුද්ගලයෙකුට සතියක කාලයක් සඳහා), කැසට් උදුන, කැසට් සිලින්ඩර,ආහාර(හාල්, ක්ෂණික නූඩ්ල්ස්, කල් තබා ගත හැකි ආහාර වර්ග, රසකැවිලි වර්ග යනාදිය)
•අතින් ගෙන යා හැකි රේඩියෝව, අතේ ගෙන යා හැකි වැසිකිළිය, ජංගම දුරකථන බැටරිය, විදුලි පන්දම, කසල දමන මලු
•අත්‍යවශ්‍ය ඖෂධ, සනීපාරක්ෂක ද්‍රව්‍ය, පිටිකිරි, ඩයපර් ආදිය.

〔හදිසි භාණ්ඩ සඳහා උදාහරණ〕
□වතුර, □හදිසි ආහාර වර්ග, □ජංගම දුරකතන බැටරි,
□විදුලි පන්දම්, □හිස් ආවරණ, ආපදා වැළැක්වීමේ ආවරණය,
□අත්‍යවශ්‍ය බෙහෙත්, □මුදල්, □බැංකු පොත,පෞද්ගලික මුද්‍රාව,
□තුවාය, □අමතර ඇඳුම් , □මුව ආවරණ, □වැසි කබා,
□විෂ කඩදාසි, □ලයිටර්, ඉටිපන්දම්, □ කසල බෑග් යනාදිය.

◇耐震化と家具の固定、感震ブレーカーの設置

古い建物 や 木造住宅 、埋立地 、低湿地 、盛土造成地にある住宅、1階部分の壁が少ない住宅などは、耐震診断を行い、耐震補強をしておきましょう。
大きな家具はしっかり固定し、寝室、子ども部屋に大きな家具は避けるようにします。避難の邪魔にならないよう家具を固定し、配置を工夫しましょう。ガラスには飛散防止フィルムを貼っておきます。
感震ブレーカーは、揺れを感知すると、ブレーカーやコンセントなどの電気を自動的に止めてくれる器具です。電気火災の予防に有効です。

◇ භූමිකම්පා ප්‍රතිරෝධය, ගෘහ භාණ්ඩ සවි කිරීම, භූ කම්පන බිඳීම් ස්ථාපනය කිරීම

පැරණි ගොඩනැගිලි, ලී ගෙවල්, ගොඩකරන ලද ඉඩම්, වගුරු බිම්, පහත් බිම්, බැම් සහිත ස්ථානයක පිහිටි, පළමු මහලේ තාප්ප අඩු නිවාස ආදිය භූමිකම්පාවලට ඔරොත්තු දෙන ලෙස භූමි විනිශ්චය සිදු කර භූ කම්පන වලට ඔරොත්තු දෙන ආකාරයට තබා ගනිමු.
විශාල ගෘහ භාණ්ඩ තදින් සවි කර, නිදන කාමර සහ ළමා කාමරවල විශාල ප්‍රමාණයේ ගෘහ භාණ්ඩ නොතැබීමට වග බලා ගන්න. හදිසි අවස්ථාවක අදාල ස්ථානයෙන් පිටවී යාමට බාධා නොවන පරිදි ගෘහ භාණ්ඩ සවි කර, පිරිසැලසුමක් සකස් කරන්න. වීදුරු කැඩී නොයන ආකාරයේ ආවරණ භාවිත කරන්න.
භූ කම්පන බිඳීමක් යනු පොළවේ යම් සෙලවීමක් දැනෙන විට බ්‍රේකර් හෝ පිටවාන වැනි විදුලිය ස්වයංක්‍රීයව විසන්ධි කරන උපකරණයකි. එය විදුලි ගිනි වැළැක්වීම සඳහා ඵලදායී උපකරණයක් වේ.

◇危険な場所や避難場所の確認

台風や大雨、津波などが起こった時に、浸水の恐れのある場所や、土砂崩れがおきる恐れのある場所などを、市町村のハザードマップなどで確認しておきます。
安全に避難するため、災害に応じた避難場所や道順を確認しておきましょう。大雨のときと津波のときでは避難場所が違うことがあります。

◇ අනතුරුදායක ස්ථාන හා හදිසි අවස්ථාවක යා යුතු ආරක්ෂිත ස්ථාන තහවුරු කර ගැනීම

සුළි සුළඟක් හෝ දරුණු වර්ශාපතනයකදී ගංවතුර තත්වයන් ඇති විය හැකි ස්ථාන හා නායයෑමේ අවදානමක් ඇති ස්ථාන පිළිබඳව ඔබේ නගර සභාවේ උපදෙස් සිතියම පරීක්ෂා කර අවබෝධයක් ලබා ගන්න.
ආරක්ෂිතව ආපදා රැඳවුම් මධ්‍යස්ථානයක් වෙත යාම සඳහා, ආපදාවට අනුරූප වන ආරක්ෂිත ස්ථානයක් සහ දිශාවක් සොයා පරීක්ෂා කර තබා ගන්න. අධික වර්ෂාවකදී හෝ සුනාමි අවස්ථාවක දී එම ආරක්ෂිත ස්ථාන වෙනස් විය හැක.

◇防災訓練

日本は世界有数の地震の多い国です。
日ごろから市町村や町内会・自治会、自主防災組織などが行う防災訓練に参加し、災害が起こったときの行動を確認しておきましょう。

■ 地震が起こったら

①緊急地震速報
地震が起こる前に、これから地震が起こることを伝える緊急地震速報が出ることがあります。地震が起こるまでのわずかな時間で、自分の身を守る準備をしましょう。
②地震発生
テーブルや机の下にもぐって身を守り、揺れが収まるのを待ちます。
③揺れが収まったら
津波やがけ崩れの危険のある場所では、すぐに避難します。
すばやく火を止め、ドアや窓を開けて脱出口を確保します。
④避難、家族の安否確認

ラジオなどで正確な情報を確認し、家屋倒壊の危険があれば避難します。靴を履き、非常用持出品を用意し、徒歩で避難します

電気のブレーカーを落としてから避難しましょう。感震ブレーカーを設置しておくと、自動的に電気を止めてくれます。
離れた家族の安否を確認します。電話はなるべく使わず、災害用伝言サービスを使いましょう。

・災害用伝言ダイヤル〈171〉
http://www.ntt-east.co.jp/saigai/voice171/
・Web171
http://www.ntt-east.co.jp/saigai/web171/index.html
・携帯電話災害用伝言版
〈NTTドコモ〉
https://www.nttdocomo.co.jp/info/disaster/index.html
（日本語）

◇ ආපදා වැලැක්වීමේ අභ්‍යාස

ජපානය යනු ලෝකයෙන්ම භූමි කම්පා ඉතා බහුල රටකි.
මහ නගර සභා, අසල්වැසි සංගම්, නේවාසික සංගම් සහ ස්වේච්ඡා ආපදා නිවාරණ සංවිධාන මගින් දෙනිකව පැවැත්වෙන ආපදා වැලැක්වීමේ අභ්‍යාස වලට සහභාගී වී ආපදාවකදී කළ යුතු දේ පරීක්ෂා කර මතක තබා ගන්න.

■ භූමිකම්පාවක් සිදු වූ අවස්ථාවක

①භූමිකම්පා පූර්ව අනතුරු ඇඟවීම.
භූමිකම්පාවක් ඇති වීමට පෙර භූමි කම්පාවක් ඇති වීමට ආසන්න බව පූර්ව භූමිකම්පා අනතුරු ඇඟවීමකින් දැනුම් දෙයි. භූමිකම්පාව ඇති වන තෙක් වන කෙටි කාලය තුළ, ඔබේ ආරක්ෂාව සහතික කර ගැනීමට වග බලා ගන්න.
②භූමිකම්පාවකදී
භූ වලනය අවසාන වන තෙක් ආසන්නයේම ඇති මේසයක් යටට වී සිටින්න.
③භූ වලනය අවසාන වූ විට
ඔබ සිටින්නේ සුනාමි හෝ නායයෑමේ අවධානමකට ලක් විය හැකි ප්‍රදේශක නම් ඉක්මණින් අදාල ස්ථානයෙන් ඉවත් වීමට කටයුතු කරන්න. ඉක්මනින් ගිනි උදුන් නිවා පිටවීම සුරක්ෂිත කිරීම සඳහා දොරවල් සහ ජනෙල් විවෘත කරන්න.
④ආරක්ෂාකාරී ආපදා රැඳවුම් මධ්‍යස්ථාන කරායාම, පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීම.
නිවැරදි තොරතුරු ගුවන් විදුලිය මාර්ගයෙන් පරීක්ෂා කරන්න. ඔබේ නිවස කඩා වැටීමේ අවදානමක තිබේ නම් එම ස්ථානයෙන් ඉවත් වෙන්න. පාවහන් පැළඳ, හදිසි අවස්ථාවක රැගෙන යා යුතු දේවල් සූදානම් කර, පා ගමනින් ආරක්ෂාකාරී ස්ථාන වෙත ගමන් කරන්න.
නිවසින් ඉවත් වීමට පෙර ප්‍රධාන පරිපථ පුවරුව ක්‍රියා විරහිත කරන්න. ඔබ භූ කම්පන බිදීම් යන්ත්‍රයක් සවි කළහොත්, එය ස්වයංක්‍රියව විදුලිය ගමන් කිරීම නතර කරයි.
පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව තහවුරු කරන්න. හැකිතාක් දුරකථනය භාවිතයෙන් වැළකී ආපදා පණිවිඩ සේවාව භාවිතා කරන්න.

•හදිසි ආපදා ඇමතුම් <171>
http://www.ntt-east.co.jp/en/saigai/voice171/index.html
•වෙබ්**171**
http://www.ntt-east.co.jp/saigai/web171/index.html
•ආපදා හදිසි පණිවිඩ ඇමතුම් හි ජංගම දුරකතන අනුවාදය
<NTT DoCoMo ජංගම දුරකතන>
https://www.nttdocomo.co.jp/info/disaster/index.html
（ජපන් භාෂා）

https://www.nttdocomo.co.jp/english/info/disaster/index.html
(英語)

〈au〉
https://www.au.com/mobile/anti-disaster/saigai-dengon/(日本語)
https://www.au.com/english/mobile/anti-disaster/saigai-dengon/(英語)

〈ソフトバンク〉
https://www.softbank.jp/mobile/service/dengon/boards/(日本語)
〈ワイモバイル〉
http://www.ymobile.jp/service/dengon(日本語)
〈楽天モバイル〉
https://network.mobile.rakuten.co.jp/service/disaster_board/(日本語)

⑤応急救護
大きな災害のときは救助隊もすぐに来ることはできません。隣近所で助けあって消火や救出活動を行います。日ごろから防災訓練に参加し、練習しておきましょう。

⑥避難所
各市町村にあります。
無料で、誰でも利用でき、宿泊も可能です。

ラジオ等で情報を常に収集します。
食事は提供されますが、まずは、備蓄品で乗り切ります。
自主防災組織を中心に、避難所では助け合いを大切にしましょう。

◇津波
千葉県は三方を海で囲まれているため、地震のときには津波の被害が心配です。
海岸にいるときに地震を感じたら、できるだけ海岸から離れて高いところへ逃げます。

https://www.nttdocomo.co.jp/english/info/disaster/index.html
(ඉංග්‍රීසි භාෂා)

〈au ජංගම දුරකතන〉
https://www.au.com/mobile/anti-disaster/saigai-dengon/
(ජපන් භාෂා)
https://www.au.com/english/mobile/anti-disaster/saigai-dengon/
(ඉංග්‍රීසි භාෂා)

<Softbank ජංගම දුරකතන>
https://www.softbank.jp/mobile/service/dengon/boards/
(ජපන් භාෂා)
<Y!mobile ජංගම දුරකතන>
http://www.ymobile.jp/service/dengon (ජපන් භාෂා)
<රකුතෙන් මොබයිල් >
https://network.mobile.rakuten.co.jp/service/disaster_board/
(ජපන් භාෂා)

⑤ප්‍රථමාධාර
මහා පරිමාණ ව්‍යසනයක දී, ගලවා ගැනීමේ කණ්ඩායමට ක්ෂණිකව ඔබ ආධාර ඉල්ලන ස්ථානය වෙත ලහා වීමට නොහැකි විය හැකිය.එවන් අවස්ථා වල තම අසල්වැසි පිරිස් සමඟ ගිනි ඇති විය හැකි අවස්ථා අවම කර, ගලවා ගැනීමේ මෙහෙයුම් වලට දායකත්වය ලබා දෙන්න.ආපදා වැළැක්වීමේ අභ්‍යාස සහ පුහුණු සඳහා සහභාගී වීමට වග බලා ගන්න.

⑥ආපදා රැඳවුම් මධ්‍යස්ථාන
සෑම නගර සභාවකම ආපදා රැඳවුම් මධ්‍යස්ථාන පවතී.
එය නොමිලේ, ඕනෑම කෙනෙකුට එය භාවිතා කළ හැකි අතර එහි රැඳී නවාතන් ගැනීමට ද පුලුවනි.
සෑම විටම ගුවන්විදුලිය ආදියෙන් තොරතුරු රැස් කරගන්න.
එවන් අවස්ථා වල ආහාර සපයනු ලබන නමුත් පළමුව ඔබගේ ආහාර සංචිත පරිභෝජනයට ගන්න.
ස්වේච්ඡා ආපදා වැළැක්වීමේ සංවිධාන ආපදා නිවාරණ මධ්‍යස්ථානවලදී එකිනකාට උපකාර කරගැනීම ඉතා වැදගත්ය.

◇ සුනාමි
විබා ප්‍රාන්තය පැති තුනකින් මුහුදෙන් වටවී ඇති බැවින් භූමිකම්පාවකදී සුනාමි තත්වයක් ඇති විය හැකි අවධානමක් පවතී.
ඔබ වෙරළේ සිටින විට භූ වලනයක් දැනෙන්නේ නම්, වෙරළෙන් හැකිතාක් දුරට උස් බිම් වෙත ඉවත් වන්න.

＜津波に対する心得＞

①強い地震を感じたときは、または弱い地震であっても長い時間ゆっくりとした揺れを感じたときは、直ちに海岸から離れ、高い場所に避難します。
②地震を感じなくても、津波警報が発表されたときは、すぐに避難します。
③津波は繰り返し襲ってくるので、警報が解除されるまで避難を続けます。

＜සුනාමි ගැන ඔබ දැනගත යුතු දේ＞

① ප්‍රබල භූමිකම්පාවක් හෝ දුර්වල නමුත් විටින් විට පසු කම්පන සහිත භූමිකම්පාවක් ඇති වුවහොත්, හැකි ඉක්මනින් වෙරළෙන් ඉවත් වී උස් ස්ථානයකට යාමට වග බලා ගන්න.
② ඔබට භූ වලනයක් නොදැනුන ද, සුනාමි අනතුරු ඇඟවීමක් නිකුත් කළහොත් වහාම අදාල ස්ථානයෙන් ඉවත් වන්න.
③ සුනාමි අවස්ථාවක එක වරක් මුහුදු රළ ගොඩට ගැලීමෙන් පසු නැවත මුහුදු රළ ගොඩට ගැලීමක් සිදුවිය හැකි බැවින්, සුනාමි අනතුරු ඇඟවීම ඉවත් කරන තෙක් එම ස්ථාන වලින් ඉවත් වී සිටින්න.

・災害のときによく使われる日本語　හදිසි ආපදා අවස්ථාවක භාවිත වන ජපන් භාෂා වාක්‍ය ඛණ්ඩ

避難 hinan	にげること	පැන දිවීම
高台 takadai	高いところ	උස් බිම්
迂回 ukai	違う道を行く	විකල්ප මාර්ග වල ගමන් කරන්න
安否 anpi	大丈夫かどうか	ඔබ හොඳින් ද නැද්ද යන වග
停電 teiden	電気が止まる	විදුලිය නතර වීම
断水 dansui	水道が止まる	ජලය නතර වීම
給水車 kyusuisya	水を配る車	ජලය සපයන වාහන
不通 futsu	通ることができない	හරහා ගමන් කළ නොහැක

■ 台風・大雨

日本では、毎年多くの台風が襲来し、強風や大雨によりたびたび大きな被害が起こっています。気象情報に注意し、事前に十分な対策を取りましょう。また、市町村から避難情報が発表されたときは、すぐに避難しましょう。

■ සුළි කුණාටු / අධික වර්ශාපතනය

සෑම වසරකම බොහෝ සුළි කුණාටු ජපානයට පැමිණෙන අතර තද සුළං සහ අධික වර්ෂාව මගින් දැඩි හානිසිදු වේ.ඔබ කාලගුණ තොරතුරු පිළිබඳව අවදානය අවධානය යොමු කර කල්තියා ප්‍රමාණවත් පූර්වාරක්ෂාවක් සූදානම් කර ගන්න.එසේම,ඔබ ජීවත් වන ප්‍රදේශයේ මහ නගර සභාව මගින් ආරක්ෂිත ස්ථාන කරා යා යුතු බවට ප්‍රකාශයට පත් කරන්නේ නම්, වහාම ඔබ සිටින ස්ථාන වලින් ඉවත් වීමට ක්‍රියා කරන්න.

◇台風・大雨に対する備え

①家の周りを一周し、飛ばされそうな物はすべて室内に入れるか、固定します。浸水などの恐れがあるところでは、家財道具や食料品などの生活用品を高い場所へ移動します。

②停電に備えて、懐中電灯や携帯ラジオ、携帯電話のバッテリーなどを準備しておきます。

③断水などの恐れのため、飲料水を確保しておきます。
④気象情報に注意してください。

◇ සුළි කුණාටු සහ අධික වැසි සඳහා සූදානම

① නිවස අවට පරීක්ෂාවට ලක් කර, සුළඟට හසුවී පාවී යා හැකි සියලුම දේවල් කාමරය තුළට දමා හෝ සවි කර තබන්න. ගංවතුර අවදානමක් පවතින ස්ථානවල ගෘහ භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය හෝ අනෙකුත් දෛනික අවශ්‍යතා සපුරන භාණ්ඩ ඉහළ ස්ථානයක තබන්න.
② විදුලිය ඇනහිටීමකට පෙර සූදානමක් ලෙස විදුලි පන්දමක්, අතේ ගෙන යා හැකි රේඩියෝවක් සහ ජංගම දුරකථන බැටරි සූදානම් කර තබා ගන්න.
③ ජලය ඇනහිටීමේ අවදානමක් ඇති බැවින්, කල්තියා ජලය සූදානම් කර තබා ගන්න.
④ කාළගුණ වාර්තා සඳහා ඔබගේ අවධානය යොමු කරන්න.

⑤むやみに外出しないでください。公共交通機関が事前に運行を止めることがありますので、運行情報に注意してください。
⑥病人や乳幼児、身体の不自由な人を安全な場所に移動させます。
⑦市町村が発する避難に関する情報に注意して、できるだけ早めの避難を心がけてください。避難に時間がかかる家族がいる場合は、早めに移動を開始しましょう。

⑤ අත්‍යවශ්‍ය කාරණයක් නොවන්නේ නම් මිස පිටතට නොයන්න. පොදු වාහන ධාවනය ඇතැම් විට නතර විය හැකි බැවින් නවතම මෙහෙයුම් තොරතුරු පිළිබඳ ව යාවත්කාලීන ව සිටින්න.
⑥ රෝගී පුද්ගලයන්, ළදරුවන් හෝ ආබාධිත පුද්ගලයන් ආරක්ෂිත ස්ථානයකට ගෙන යන්න.
⑦ මහ නගර සභාව විසින් ප්‍රාකාශයට පත් කරන ලද ආරක්ෂාකාරී ස්ථාන වෙත යාම පිළිබඳව අවධානය ලබා දී ඔබට හැකි ඉක්මණින් එතනින් ඉවත් වීමට කටයුතු කරන්න. ඔබේ පවුල ආරක්ෂාකාරී ස්ථාන වෙත ඉවත් වීමට බොහෝ කාලයක් ගත වන බවක් පෙනේ නම්, ඉවත් වීමේ කටයුතු ඉක්මනින් ආරම්භ කරන්න.

◇避難行動

「警戒レベル」で避難のタイミングを考えましょう。警戒レベル3「高齢者等避難」、4「避難指示」が発令されたときは、すぐに避難してください。

〔**警戒レベル1**〕災害への備えを確認しましょう。気象庁から「早期注意情報」が発表されます。

〔**警戒レベル2**〕避難場所や道順などを確認しましょう。気象庁から「気象注意報」が発表されます。

〔**警戒レベル3**〕避難に時間がかかる高齢者や障害のある方、乳幼児などは避難しましょう。市町村から「高齢者等避難」が発令されます。

〔**警戒レベル4**〕危険な場所から全員が避難しましょう。市町村から「避難指示」が発令されます。

〔**警戒レベル5**〕災害が発生又は切迫しています。命を守る行動をとりましょう。市町村から「緊急安全確保」が発令されます。

◇ ආරක්ෂිත ස්ථාන කරා ඉවත් වීමේ පටි පාටිය

අනතුරු ඇඟවීමේ මට්ටම මත පදනම්ව ඉවත් වීමේ වේලාව පිළිබඳව කල්පනා කරමු. 3 වන අනතුරු ඇඟවීමේ මට්ටම වන වයෝවෘද්ධ පුද්ගලයන් ආදිය සඳහා වන ඉවත් වීම්, 4 වන අනතුරු ඇඟවීමේ නියෝගයක් නිවේදනය කළ විට, කරුණාකර වහාම ඉවත් වන්න.

[අනතුරු ඇඟවීම් මට්ටම 1] හදිසි ආපදා අවස්ථාවක් සඳහා වන සූදානම් වීම් තහවුරු කරගමු.

ජපාන කාලගුණ විද්‍යා ඒජන්සිය විසින් "පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු" නිකුත් කරනු ඇත.

[අනතුරු ඇඟවීම් මට්ටම 2] ඔබගේ ළඟම ඇති ඉවත් වීමේ මධ්‍යස්ථාන සහ මාර්ග ඇති ස්ථානය තහවුරු කරගමු.

ජපාන කාලගුණ විද්‍යා ඒජන්සිය විසින් "කාලගුණ අනතුරු ඇඟවීම්" නිකුත් කරයි.

[අනතුරු ඇඟවීම් මට්ටම 3]ඉවත් වීමට වැඩි කාලයක් ගතවන වයෝවෘද්ධ පුද්ගලයන්, ආබාධ සහිත පුද්ගලයින් සහ ළදරුවන් ඉවත් වෙමු.ඔබ අයත් මහ නගර සභාව විසින් අදාල ස්ථාන වලින් ඉවත් වීමේ සූදානම පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කරනු ඇත.

[අනතුරු ඇඟවීම් මට්ටම 4] මෙම මට්ටමේදී සියලු දෙනා ඉවත් විය යුතුය. අනතුරුදායක ප්‍රදේශවලින් සියලු දෙනා ඉවත් වෙමු.ඔබ අයත් මහ නගර සභාව ඉවත් කිරීමේ නියෝගය ප්‍රකාශයට පත් කරනු ඇත.

[අනතුරු ඇඟවීම් මට්ටම 5]ආපදාවක් සිදු වී තිබේ හෝ ඇති වීමට ආසන්නය. ඔබගේ ආරක්ෂාව තහවුරු කරගන්න. ඔබ අයත් මහ නගර සභාව "හදිසි ආරක්ෂක නියෝග" නිකුත් කරනු ඇත.

■ 火事

日本の家やアパートは木造で、畳やふすまなど燃えやすいものが多くあります。日ごろから火事をおこさないように十分注意しましょう。

■ ගිනි ගැනීම්

බොහෝ ජපන් නිවාස සහ මහල් නිවාස ලී වලින් සාදා ඇති අතර, තතමි නම් පැදුරු (සනකම් පැදුරු) සහ ෆුසුමා (ස්ලයිඩින් දොරවල්) වැනි දැවෙන සුළු ද්‍රව්‍ය අඩංගු වේ. එමනිසා, ගින්නක් ඇති නොවන පරිද්දෙන් නිරන්තරයෙන් ඒ පිලිබඳ සැලකිලිමත් විය යුතුය.

◇火事を起さないためのポイント

①寝たばこは絶対やめる。
②ストーブは燃えやすいものから離れたところで使う。
③ガスコンロなどのそばを離れるときは、必ず火を消す。
④住宅用火災警報器は全ての住宅に設置する必要があります。
⑤寝具、衣類、カーテンからの火災を防ぐために防炎品を使う。
⑥火災を小さいうちに消すために住宅用消火器を設置する。
⑦隣近所の協力体制をつくる。

◇ගින්නක් වැළැක්වීම සඳහා උපදෙස්

① ඇඳ මත දුම් පානය නොකරන්න.
② පහසුවෙන් දැවෙන වස්තූන්ගෙන් බොහෝ දුරින් ඔබේ උදුන් භාවිතා කරන්න.
③ ඔබ උදුන තබා ඇති ස්ථානයෙන් ඉවත් වන විට ගින්දර නිවා දැමීමට වග බලා ගන්න.
④ සෑම නිවසකම දුම් අනාවරක ස්ථාපනය කිරීම අවශ්‍ය වේ.
⑤ ඇඳ ඇතිරිලි, ඇඳුම් සහ තිර රෙදි වලින් ගිනි ගැනීම් වැළැක්වීම සඳහා ගිනි වැළැක්වීමේ නිෂ්පාදන භාවිතා කරන්න.
⑥ ගින්න නිවා දැමීමට හැකි වන පරිදි ඔබේ නිවසේ ගිනි නිවන උපකරණයක් තබාගන්න.
⑦ ඔබේ අසල්වැසියන් සමඟ යම් ආකාරයක සහයෝගිතා පද්ධතියක් සාදාගන්න.

3 行政手続き

පරිපාලන ක්‍රියා පටිපාටිය

日本で生活するときには、各種の行政手続き(住民登録、出生届、婚姻届、離婚届、死亡届、印鑑登録、国民健康保険、税金など)が必要になります。これらは、主に居住している市区町村役所で受付けしています。これらの手続きをすると各種証明書の交付を受けることができます。

ජපානයේ ජීවත් වන විට, විවිධ පරිපාලන ක්‍රියා පටිපාටි (පදිංචි ලියාපදිංචිය, උප්පැන්න ලියාපදිංචි කිරීම, විවාහ ලියාපදිංචි කිරීම, දික්කසාද ලියාපදිංචි කිරීම, මරණ ලියාපදිංචි කිරීම, මුද්‍රා ලියාපදිංචි කිරීම, ජාතික සෞඛ්‍ය රක්ෂණය, බදු ආදිය) අවශ්‍ය වනු ඇත.මෙම සේවාවන් ඔබ පදිංචි නාගරික කාර්යාලයෙන් ලබා ගත හැක. මෙම ක්‍රියා පටිපාටි සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට විවිධ සහතික පත්‍ර ලබා ගැනීමට හැකි වනු ඇත.

■ 住居地の(変更)届出

住居地の届出をすると、日本人と同様に、外国人住民の方についても住民票が作成されます。

■පදිංචිය (වෙනස කිරීම) ආශ්‍රිත දැනුම්දීම්

ජපානයේ ඔබ පදිංචි ස්ථානය ලියාපදිංචි කිරීමේදී, ජපන් ජාතිකයන් හා සමානව විදේශිකයන් සඳහා වන පුරවැසි කාඩ් පතක් නිකුත් කරනු ලැබේ.

◇新たに来日された方

出入国港において在留カードが交付された方(*)は、住居地を定めてから 14日以内に、在留カードを持参の上、市区町村役所の窓口でその住居地を届け出てください。

(*)パスポートに「在留カードを後日交付する」旨の記載がなされた方は、パスポートを持参してください。

◇පළමුවරට ජපානය වෙත පැමිණි අය සඳහා

ජපානයට ඇතුල්වීමේදී හෝ පිටවීමේ දී (*) පුරවැසි කාඩ්පතක් ලැබී ඇති අය ඔවුන් පදිංචි වන ස්ථානය තීරණය කිරීමෙන් පසු, දින 14ක් ඇතුළත පුරවැසි කාඩ් පත ද සමඟ ජීවත් වන නගරයේ හෝ ප්‍රදේශයේ නගර ශාලාවට ගොස් පදිංචිය ලියාපදිංචි කරගත යුතුය.

(*) "පසුකාලීනව පුරවැසි කාඩ්පතක් නිකුත් කරනු ලැබේ" යනුවෙන් සඳහන් විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් කර ඇත්නම්, එවැනි අවස්ථාවක, කරුණාකර ඔබගේ විදේශ ගමන් බලපත්‍රය ඔබේ නගර සභා කාර්යාලයට ගෙන ඒමට සහ අවශ්‍ය ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට වග බලා ගන්න.

◇引越しをされた方

中長期在留者の方が、住居地を変更した時は、移転した日から 14日以内に、在留カードを持参の上、移転先の市区町村役所の窓口でその住居地を届け出てください。

◇ පදිංචිය මාරු කරන අය සඳහා

මධ්‍ය සහ දිගු කාලීන පදිංචිකරුවන් තම පදිංචි ස්ථානය වෙනස් කරන විට, පදිංචිය වෙනස් කල දින සිට දින 14ක් ඇතුළත, ඔබේ පුරවැසි කාඩ්පත රැගෙන නව පදිංචි ස්ථානයේ නාගරික කාර්යාලයට ගොස් ලියාපදිංචි වන්න.

■ マイナンバー制度

住民票のある外国人(中長期在留者、特別永住者等)には、日本人と同様にマイナンバーと呼ばれる 12桁の個人番号が市町村から通知されます。この個人番号は、社会保障や税、災害安否等に活用されます。

■තනි පුද්ගල අංක (“මගේ අංකය”) පද්ධතිය

නේවාසික කාඩ්පතක් හිමි විදේශිකයන්ට (මධ්‍ය හා දිගුකාලීන පදිංචිකරුවන් සහ විශේෂ ස්ථිර පදිංචිකරුවන් ඇතුළු) ජපන් ජාතිකයින් හා සමානවම “මගේ අංකය(මයි නම්බර්)” ලෙස හඳුන්වනු ලබන ඉලක්කම් 12කින් යුතු පෞද්ගලික අංකයක් නාගරික කාර්යාලයකින් ලබාදෙනු ඇත. මෙම පෞද්ගලික අංකය සමාජ ආරක්ෂණය, බදුකරණය සහ ආපදා ප්‍රතිචාරයට අදාළ පරිපාලන ක්‍රියා පටිපාටිවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට භාවිත කෙරේ.

◇マイナンバーカード

マイナンバーカードを受け取るには、申請が必要です。郵送やスマートフォン、パソコンなどで、申請ができます。マイナンバーカードは、本人確認のための身分証明書として利用でき、医療機関で診察を受ける時や、コンビニエンスストアで住民票の写し等を取得する時に使用されます。

また、在留資格認定証明書交付申請や在留資格変更許可申請などの在留手続をオンラインで申請できます。

(マイナンバーカード総合サイト)

https://www.kojinbango-card.go.jp

■ 結婚をしたとき〔婚姻届〕

日本で結婚する場合、日本人配偶者は戸籍謄本を、外国人は下記の書類（提出書類が外国語の場合には、日本語の訳文も必要となります）を持って、居住地の市区町村役所に婚姻の届出をします。

自国の大使館又は領事館へ届出が必要な場合は、市区町村役所で婚姻届受理証明書をもらって、届出をします。在留手続きや住民登録について変更がある場合は、それらの手続きも必要となります。

詳しいことは、市区町村役所に問い合わせてください。

〔必要書類〕

①婚姻届出書
（市区町村役所に置いてあります。）

②パスポート

③婚姻要件具備証明書（結婚する相手が独身であり、自国の法律で結婚できる条件を備えているということを自国政府が証明した公的文書のことです。自国に戸籍制度がある場合には戸籍謄本がこれに当たります。）

・日本にある大使館又は領事館で発行してもらいます。

◇තනි පුද්ගල අංක කාඩ්පත(“මගේ අංකය” කාඩ්පත)

තනි පුද්ගල අංක(“මගේ අංකය”) කාඩ්පත ලබා ගැනීම සඳහා අයදුම් කළ යුතුය. ඔබට තැපෑලෙන්, ජංගම දුරකතනයෙන් හෝ පරිගණකයෙන් අයදුම් කළ හැකිය. තනි පුද්ගල අංක(“මගේ අංකය”) කාඩ්පත පුද්ගල අනන්‍යතාවය සඳහා වන හැඳුනුම්පතක් ලෙස භාවිතා කළ හැකි අතර, එය වෛද්‍ය මධ්‍යස්ථානයක ප්‍රතිකාර ලබා ගැනීමේදී හෝ කොන්බිනියකින් ඔබේ පදිංචි සහතිකයේ පිටපතක් ලබා ගැනීමේදී භාවිතා කළ හැක.

සුදුසුකම් සහතිකයක් සඳහා අයදුම් කිරීම හෝ ඔබගේ පදිංචිය වෙනස් කිරීම සඳහා අයදුම් කිරීම වැනි නේවාසික ක්‍රියා පටිපාටි සඳහා ද ඔබට මාර්ගගත ක්‍රම හරහා අයදුම් කළ හැකිය.

（තනි පුද්ගල අංක (“මගේ අංකය”) කාඩ්පත් පුළුල් වෙබ් අඩවිය ）

https://www.kojinbango-card.go.jp/en/

■ විවාහය (විවාහ ලියාපදිංචිය)

ජපානයේදී විවාහ ලියාපදිංචියක් සිදු කරන විට, සහකරු හෝ සහකාරිය ජපන් ජාතිකයෙකු නම්, ඔහු හෝ ඇය තම පවුල් ලේඛනයේ නිල පිටපතක් රැගෙන ආ යුතු අතර, සහකරු හෝ සහකාරිය විදේශ ජාතිකයෙකු නම් පහත සඳහන් ලියකියවිලි රැගෙන ආ යුතුය. (ඉදිරිපත් කරන ලේඛන විදේශීය භාෂාවකින් ලියා තිබේ නම්, ඒවා ජපන් භාෂාවට පරිවර්තනය කළ යුතුය) එම ලිපි ලේඛන රැගෙන පැමිණි විට ඔබ අයත් වන නගර සභා කාර්යාලයේ දී විවාහය ලියාපදිංචි කරනු ලබයි.

ඔබට ඔබේ රටේ තානාපති කාර්යාලයට හෝ කොන්සල් කාර්යාලයට දැනුම් දීමක් කිරීමට අවශ්‍ය නම්, ඔබ නගර සභා කාර්යාලයෙන් විවාහ ලියාපදිංචිය පිළිගැනීමේ සහතිකය ලබාගෙන ඉදිරිපත් කරන්න. පදිංචිය පිළිබඳ ක්‍රියාපටිපාටිය හෝ නේවාසික ලියාපදිංචිය සම්බන්ධයෙන් යම් වෙනස්කම් තිබේ නම්, ඔබ එම ක්‍රියා පටිපාටි ද සම්පූර්ණ කළ යුතුය.

වැඩි විස්තර සඳහා කරුණාකර නගර සභා, ප්‍රාදේශීය සභා කාර්යාල වලින් විමසන්න.

(අවශ්‍ය ලියකියවිලි)

① විවාහ දැනුදීමේ පෝරමය
(නගර සභ ප්‍රාදේශීය සභා කාර්යාල වෙතින් ලබා ගත හැකිය.)

② ගුවන් ගමන් බලපත්‍රය

③ විවාහ ගිවිසගැනීම සඳහා නෛතික හැකියාව පිළිබඳ සහතිකය (ඔබ තනිකඩ බවත්, ඔබේ රටේ නීතිය යටතේ විවාහය සඳහා අවශ්‍ය කොන්දේසි සපුරාලන බවත් සඳහන් කරමින් ඔබේ රටේ රජය විසින් නහවුරු කරන ලද නිල ලේඛනයක්; ඔබේ රටේ පවුල් ලියාපදිංචි කිරීමේ පද්ධතියක් තිබේ නම්, ඔබගේ පවුලේ ලේඛනයේ නිල පිටපතක් ඒ සඳහා ප්‍රමාණවත් වේ).

・ජපානයේ ඔබගේ රටේ තානාපති කාර්යාලය හෝ කොන්සල් කාර්යාලය ඒවා නිකුත් කරනු ඇත.

・日本語以外の言葉で書かれている場合には、翻訳者名を付けた日本語訳が必要です。

必要書類については、市区町村役所に確認してください。

■ 離婚をしたとき〔離婚届〕

夫婦のどちらかは日本人の場合、夫婦ともに同意すれば、離婚することができます。下記の書類を持って、居住地の市区町村役所に離婚の届出をしてください。

夫婦双方が外国人の離婚については、居住条件によって届出することができない場合がありますので、詳しいことはそれぞれの大使館又は領事館と、居住地の市区町村役所で確認してください。

〔必要書類〕
①離婚届出書
②日本人配偶者の戸籍謄本
③日本人配偶者の住民票
④パスポート
必要書類については、市区町村役所に確認してください。

■ 妊娠したとき〔母子健康手帳〕

妊娠したとき、市区町村役所に届出をすると「母子健康手帳」が交付されます。妊娠から生まれた子どもの予防接種、健康診査などを記録します。(→P39) 詳しいことは、市区町村役所に問い合わせてください。

■ 子どもが生まれたとき〔出生届〕

◇国籍

両親のどちらかが日本人で法的結婚をしている場合は、日本国籍が取れます。同時に、子どもが日本以外の国籍も取る場合は、22才までにどちらかの国籍を選びます。

両親とも外国籍の場合は、日本で生まれても日本国籍を取ることができません。両親の国の法律に従って国籍を取ります。

・මෙම ලේඛන ජපන් භාෂාවෙන් හැර වෙනත් භාෂාවකින් ඇත්නම්, එය ජපන් භාෂාවට පරිවර්තනය කර පරිවර්තකයාගේ නම ද ඇතුළත් කළ යුතුය.

අත්‍යවශ්‍ය ලියකියවිලි සම්බන්ධයෙන් නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල හරහා තොරතුරු පරීක්ෂා කරන්න.

■දික්කසාදය (දික්කසාද ලියාපදිංචිය)

විවාහක සහකරු හෝ සහකාරිය ජපන් පුරවැසියෙකු නම්, කාලාත්‍රයන් දෙදෙනාම එකඟ වුවහොත් ඔවුන්ට දික්කසාද විය හැකිය. දික්කසාදයක් ලියාපදිංචි කිරීම සඳහා පහත ලියකියවිලි ඔබ පදිංචි ස්ථානයේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත රැගෙන එන්න.
කාලාත්‍රයන් දෙදෙනාම විදේශිකයන් නම්, ඔවුන්ගේ නේවාසික සුදුසුකම් අනුව දික්කසාද ලියාපදිංචිය ඉදිරිපත් කිරීමට ඔවුන්ට නොහැකි විය හැකිය. වැඩි විස්තර සඳහා කරුණාකර ඔබගේ තානාපති කාර්යාලය හෝ කොන්සල් කාර්යාලය හෝ ඔබ පදිංචි ස්ථානයේ පිහිටි නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල අමතන්න.
(අවශ්‍ය ලියකියවිලි)
① දික්කසාද ලියාපදිංචි අයදුම්පත
② ජපන් කලත්‍රයාගේ පවුල් ලේඛනයේ නිල පිටපත
③ ජපන් සහකරු හෝ සහකාරියගේ පදිංචිය පිළිබඳ සහතිකය
④ ගුවන් ගමන් බලපත්‍රය
අත්‍යවශ්‍ය ලියකියවිලි සම්බන්ධයෙන් නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල හරහා තොරතුරු තහවුරු කරගන්න.

■ගර්භණීභාවය (මාතෘ හා ළමා සෞඛ්‍ය අත්පොත)

ඔබේ ගර්භණීභාවය ඔබේ නගර සභා හෝ ප්‍රාදේශීය සභා කර්යාලයට වාර්තා කරන විට, ඔබට මාතෘ හා ළමා සෞඛ්‍ය අත්පොතක් ලබා දෙනු ඇත. ඔබේ දරුවාගේ එන්නත් සහ සෞඛ්‍ය පරීක්ෂණ තොරතුරු මෙහි සටහන් වේ.(→P39)වැඩි විස්තර සඳහා නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල වලින් විමසන්න.

■දරු උපත් (උප්පැන්න ලියාපදිංචිය)

◇ජාතිය

දෙමව්පියන්ගෙන් කෙනෙකු ජපන් ජාතිකයෙක් නම් සහ නීත්‍යානුකූලව විවාහක නම්, දරුවාට ජපන් පුරවැසිභාවය ලබා ගත හැකිය. එසේම, දරුවෙකු ජපානය හැර වෙනත් රටක පුරවැසිභාවය දරන්නේ නම්, ඔවුන් වයස අවුරුදු 22 වන විට එක් ජාතිකත්වයක් තෝරා ගත යුතුය.
දරුවා ජපානයේ උපත ලැබුවද දරුවාගේ දෙමාපියන් දෙදෙනාම විදේශිකයන් නම් දරුවාට ජපන් පුරවැසිභාවය ලබා ගැනීමට නොහැකි වේ. මෙහිදී, දරුවාගේ දෙමාපියන්ගේ මව් රටේ නීති අනුගමනය කර ජාතිකත්වය ලබාගත යුතුය.

◇出生の手続き

①子どもが生まれてから 14日以内に出生地の市区町村役所の住民課に出生届を提出します。届出書は、市区町村役所にもありますが、通常、出産した病院で渡される出生証明書と一体になっています。

・母子健康手帳 の 出生届出済証明 の 記載 、乳幼児 の 医療費 の 助成 、 児童 手当 、国民健康保険に加入している人は出産一時金の申請や子どもの加入の手続きなども市区町村役所で併せて行います。

②自国の在日大使館又は領事館に出生届を提出し、子どものパスポートを受け取ります。

③日本で出生し、60日以上在留する場合は、出生から30日以内に住居地を管轄する出入国在留管理局に在留資格の取得許可申請が必要です。(→P29 出生による在留資格の取得参照)

■ 子どもを養育するとき〔児童手当〕

子どもを養育している人は、中学校を卒業するまでの子ども1 人につき、月額1万円(3歳未満と第3子以降の小学生までは 1万5千円) の子ども手当が受給できます。

受給するには、お住まいの市区町村への申請が必要です。詳しいことは、市区町村役所に問い合わせてください。

■ 亡くなったとき〔死亡届〕

死亡したときは、7日以内に医師又は検死官の死亡診断書を持って居住地の市区町村役所に届出をします。死亡届書は通常、死亡診断書・死体検案書と一体となっています。また、自国の大使館又は領事館にも届出をします。亡くなった人の在留カードは出入国管理局へ返還します。

◇උප්පැන්නය ලියාපදිංචි කිරීම

①දරුවාගේ උපතේ සිට දින 14ක් ඇතුළත දරුවා ඉපදුණු කලාපයේ පිහිටි නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලයේ නේවාසික අංශය වෙත උපත පිළිබඳ දැනුම්දීම කළ යුතුය. ලියාපදිංචි කිරීමේ පෝරමය නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබා ගත හැකි අතර, මෙය දරුවා ඉපදුණු රෝහලෙන් සාමාන්‍යයෙන් නිකුත් කරන උප්පැන්න සහතිකය සමඟ සංයුක්ත වේ.

・නගර සභා සහ ප්‍රාදේශීය සභා කාර්යාලයෙන්, මාතෘ හා ළමා සෞඛ්‍ය අත්පොතෙහි සම්පූර්ණ කරන ලද උප්පැන්න ලියාපදිංචි සහතිකය , දරුවාගේ වෛද්‍ය වියදම් සඳහා සහය, ළමා දීමනා, සහ ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනට ඇතුළත් වී සිටින පුද්ගලයන්ට එක් වරක් දරු උපත් දීමනාවක් සඳහා අයදුම්කර තම දරුවා වැඩසටහනට ඇතුළත් කළ හැකිය.

②ඔබගේ දරුවාගේ විදේශ ගමන් බලපත්‍රය ලබා ගැනීම සඳහා උප්පැන්න ලියාපදිංචි සහතිකය ඔබගේ රටේ තානාපති කාර්යාලයට හෝ කොන්සල් කාර්යාලයට ඉදිරිපත් කරන්න.

③දරුවෙකු ඉපදී ඔහු/ඇය දින 60කට වැඩි කාලයක් ජපානයේ රැඳී සිටින විට, උපත ලැබූ දින සිට දින 30ක් ඇතුළත නේවාසික ලිපිනය ආවරණය වන පරිදි කලාපීය ආගමන විගමන කාර්යාංශයෙන් පදිංචි සුදුසුකම සඳහා අවසර ලබා ගැනීමට අයදුම් කළ යුතුය. (→P29 අලුත උපන් දරුවන් සඳහා පදිංචිය පිළිබඳ සුදුසුකම ලබා ගැනීම)

■දරුවන් පෝෂණය (ළමා දීමනාවන්)

දරුවන් පෝෂණය කරන පුද්ගලයින්ට, දරුවා කණිෂ්ඨ පාසල අවසන් වන තුරු එක් දරුවෙකුට යෙන් 10,000 ක මාසික ළමා දීමනාවක් ලබා ගත හැකිය. (අවුරුදු 3 දක්වා සෑම දරුවෙකුටම යෙන් 15,000 ක් සහ දරුවන් 3දෙනෙකුට වඩා සිටීනම් 3වන දරුවාගේ සිට ප්‍රාථමික පාසලෙන් උපාධිය ලබා ගන්නා තෙක් යෙන් 15,000ක් ලබා දේ.)
දීමනාව ලබා ගැනීම සඳහා ඔබ ජීවත් වන නගරයේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලයට අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. විස්තර සඳහා කරුණාකර ඔබේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල හෝ ගමේ මහජන කාර්යාලයෙන් විමසන්න.

■මරණය (මරණ සහතික ලියාපදිංචිය)

මරණයක් සිදුවුවහොත්, වෛද්‍යවරයෙකුගේ හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ මරණ සහතිකය සමඟින් දින හතක් ඇතුළත මියගිය පුද්ගලයාගේ පදිංචි ස්ථානයේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලයට දැනුම් දීමක් කළ යුතුය. මරණ ලියාපදිංචිය සාමාන්‍යයෙන් මරණ සහතිකය හෝ පශ්චාත් මරණ සහතිකය සමඟ සිදු වේ. මියගිය පුද්ගලයාගේ රටේ තානාපති කාර්යාලයට හෝ කොන්සල් කාර්යාලයට ද දැනුම්දීමක් ඉදිරිපත් කළ යුතු අතර, මියගිය පුද්ගලයාගේ නේවාසික කාඩ්පත ආගමන විගමන කාර්යාංශය වෙත ආපසු ලබා දිය යුතුය.

■ 自動車、土地、家を買ったり、権利に係わる契約をするとき〔印鑑登録〕

日本では、サインと同じような意味で、自分の名前が刻印してある印鑑(“ハンコ”とも言われています)を使います。居住地の市区町村役所に申請し登録した印鑑を「実印」と言い、印鑑登録をすると、「印鑑登録証(カード)」が発行されます。

自動車の登録、不動産売買や商取引など権利に係わる契約をするときに、実印や印鑑登録証明書が必要となります。印鑑登録証明書は、市区町村役所で印鑑登録証を提示し、印鑑登録証明書交付申請書を記載して申請します。

■ 在留の手続き

日本に在留するときには、出入国在留管理局で手続きが必要です。

出入国在留管理局では、日本において活動できる範囲(「在留資格」といいます)と滞在できる期間(「在留期間」といいます)が記載された上陸許可証印をパスポートに押印します。

在留資格以外の活動をするときや、在留期間を過ぎて滞在するときも、出入国在留管理局で手続きします。これらの手続きをしないと、処罰されたり強制退去させられることがあります。

入国・在留資格について詳しいことは、出入国在留管理局 (→P27)、または下記「外国人在留総合インフォメーションセンター」へお問い合わせください。

◇外国人在留支援センター

外国人の在留を支援する複数の関係機関が入居しています。

(平日午前9:00-午後5:00)

■මෝටර් රථයක්, ඉඩමක්, නිවසක් මිලදී ගැනීමේදී සහ අයිතිවාසිකම් හා සම්බන්ධ කොන්ත්‍රාත්තු අත්සන් තැබීමේදී (පෞද්ගලික මුද්‍රා ලියාපදිංචිය)

ජපානය තුළ අත්සනක් හා සමාන අර්ථයෙන් තමන්ගේ නම මුද්‍රණය කරන ලද මුද්‍රාවක් (ඉන්කන් හෝ හන්කො ලෙස හැඳින්වේ) භාවිත වේ. නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලයක ලියාපදිංචි කරන ලද පුද්ගලික මුද්‍රාව "ජින්සුයින්" ලෙස හැඳින්වේ. ඔබේ මුද්‍රාව ලියාපදිංචි කිරීමෙන් පසු පුද්ගලික මුද්‍රා ලියාපදිංචි කිරීමේ සහතිකයක් (කාඩ්පතක්) නිකුත් කරනු ලැබේ.

මෝටර් රථයක් ලියාපදිංචි කිරීම, නිශ්චල දේපල මිලදී ගැනීම සහ විකිණීම හෝ වෙනත් ව්‍යාපාරික ගනුදෙනු වැනි අයිතිවාසිකම් සම්බන්ධ ගිවිසුම්වලට එළඹීමට නිල වශයෙන් ලියාපදිංචි මුද්‍රාවක් සහ පුද්ගලික මුද්‍රා ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවශ්‍ය වේ. පුද්ගලික මුද්‍රා ලියාපදිංචි කිරීමේ සහතිකය සඳහා අයදුම් කිරීමට, ඔබේ පුද්ගලික මුද්‍රා ලියාපදිංචි කිරීමේ කාඩ්පත ඔබේ නගරයේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ඉදිරිපත් කර පුද්ගලික මුද්‍රා ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ අයදුම්පත පුරවන්න.

■ ජපානයේ නේවාසික ක්‍රියා පටිපාටිය

ජපානයේ පදිංචි වීමට, ඔබ ආගමන විගමන කාර්යාංශයේ ක්‍රියා පටිපාටි සම්පූර්ණ කළ යුතුය.

ආගමන කාර්යාංශයේදී, ඔබගේ විදේශ ගමන් බලපත්‍රයේ ජපානය වෙත පැමිණීමේ අවසරය දැක්වෙන මුද්‍රාවක් අලවනු ලබන අතර, ජපානයේ ඔබට කළ හැකි දේ දැක්වෙන "පදිංචි තත්ත්වය" සහ "රැඳී සිටීමේ කාලසීමාව" ඇතුළත් වන අතර, එය ඔබට කොපමණ කාලයක් රැඳී සිටිය හැකිද යන්න පෙන්නුම් කරයි.

ඔබගේ පදිංචි කාලය තුළ දක්වා ඇති ක්‍රියාකාරකම් හැර වෙනත් ක්‍රියාකාරකම් සඳහා හෝ සඳහන් කර ඇති කාලයට වඩා වැඩි කාලයක් රැඳී සිටීමට අවශ්‍ය නම් ඔබට ආගමන කාර්යාංශයේ ඒ සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට සිදු වනු ඇත. ඔබ මෙම ක්‍රියා පටිපාටි සම්පූර්ණ නොකරන්නේ නම්, ඔබට දඬුවම් වලට හෝ පිටුවහල් කිරීමට යටත් වීමට සිදුවනු ඇත.

සංක්‍රමණය සහ පදිංචි තත්ත්වය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර ඔබේ ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශය (→P27) හෝ “විදේශීක නේවාසිකයින් සඳහා වන ජාතික තොරතුරු මධ්‍යස්ථානය” අමතන්න.

◇විදේශ ජාතිකයන් සඳහා සහයෝගිතා මධ්‍යස්ථානය(FRESC)

විදේශිකයන්ගේ පදිංචිය සඳහා ආධාර කිරීමට සම්බන්ධ සංවිධාන කිහිපයක් තිබේ.

(සතියේ දවස් පෙ.ව. 9:00 - ප.ව. 5:00)

〒160-0004
東京都新宿区四谷1-6-1
四谷タワー13階
TEL 0570-011000
TEL 03-5363-3013(IP ,海外)
〔センター内の行政機関〕
出入国在留管理庁
東京出入国在留管理局
東京法務局人権擁護部
法テラス
東京労働局外国人特別相談・支援室

東京外国人雇用サービスセンター
外務省ビザ・インフォメーション
日本貿易振興機構(ジェトロ)

◇東京出入国在留管理局四谷分庁舎
(FRESC内)

日本に在留する外国人や、外国人を雇用したい企業関係者等へ、予約制による個別相談を行っています。

在留相談
予約専用電話:03-5363-3025
(21言語に対応)
予約専用フォーム:
日本語:
https://www12.webcas.net/form/pub/fresc/yoyaku-jpn
英語:
https://www12.webcas.net/form/pub/fresc/yoyaku-eng
住所:東京都新宿区四谷1-6-1四谷タワー13階

月～金 午前9:00～午後5:00
英語、中国語、韓国語、ベトナム語、ネパール語、インドネシア語、タガログ語、タイ語、ポルトガル語、スペイン語

◇外国人在留総合インフォメーションセンター
(平日午前8:30 – 午後5:15)
東京 〒108-8255
東京都港区港南5-5-30

〒160-0004
Tokyo-to, Shinjuku-ku, Yotsuya 1-6-1
Yotsuya Tower 13F
දුරකතන: 0570-011000
දුරකතන:03-5363-3013(IP, විදේශීය)
〔මධ්‍යස්ථාන පරිපාලන ආයතන〕
ආගමන විගමන සේවා නියෝජිත ආයතනය
ටෝකියෝ ප්‍රාදේශීය ආගමන විගමන සේවා කාර්යාංශය
ටෝකියෝ නීති කටයුතු දෙපාර්තමේන්තුවෙහි මානව හිමිකම් අංශය
ජපාන නීති ආධාරක මධ්‍යස්ථානය (JLSC, හෝතෙරසු)
ටෝකියෝ කම්කරු කාර්යාංශයේ විදේශ නේවාසික උපදේශන සහ උපකාරක කාර්යාලය
විදේශිකයන් සඳහා ටෝකියෝ රැකියා සේවා මධ්‍යස්ථානය
විදේශ කටයුතු අමාත්‍යාංශය වීසා තොරතුරු
ජපාන විදේශ වෙළඳ සංවිධානය (JETRO)

◇ටෝකියෝ ප්‍රාදේශීය ආගමන විගමන සේවා කාර්යාංශය:
විදේශික නේවාසික උපකාරක මධ්‍යස්ථානයේ යොත්සුයා ශාඛා කාර්යාලය **(FRESC)**
ජපානයේ වෙසෙන විදේශීය ජාතිකයන් සඳහා සහ විදේශීය ජාතිකයින් සේවයට බඳවා ගැනීමට කැමති සමාගම් සඳහා, කලින් වෙන් කරවා ගැනීම් හරහා තනි පුද්ගල උපදේශන සේවා සපයයි.

පදිංචිය සඳහා වන උපදේශනය
වෙන් කරවා ගැනීම් සඳහා දුරකතන අංකය: 03-5363-3025
(භාෂා 21)
වෙන් කරවා ගැනීම් සඳහා වන පෝරමය:
ජපන් භාෂාව:
https://www12.webcas.net/form/pub/fresc/yoyaku-jpn
ඉංග්‍රීසි භාෂාව:
https://www12.webcas.net/form/pub/fresc/yoyaku-eng
ලිපිනය: 1-6-1, Yotsuya, Shinjuku-ku, Tokyo-to, Yotsuya Tower 13F
සදුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9:00 - ප.ව. 5:00
ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියන් භාෂාව, වියට්නාම භාෂාව, නේපාල භාෂාව, ඉන්නීසියන් භාෂාව, තග්ලොග් භාෂාව, තායි භාෂාව, පෘතුගීසි භාෂාව සහ ස්පාඤ්ඤ භාෂාව

◇විදේශික නේවාසික ජාතික තොරතුරු මධ්‍යස්ථානය
(සතියේ දින පෙ.ව. 8:30 - ප.ව. 5:15)
ටෝකියෝව 〒108-8255
Tokyo-to, Minato-ku, Konan 5-5-30

東京出入国在留管理局内

TEL 0570-013904

TEL 03-5796-7112(IP,海外)

メール　info-tokyo@i-moj.go.jp

◇外国人総合相談支援センター

〒160-0021

東京都新宿区歌舞伎町2-44-1

東京都健康センター「ハイジア」 11階

しんじゅく多文化共生プラザ内

TEL 03-3202-5535

英語、中国語　月～金

ポルトガル語、スペイン語	月・火・水
タガログ語	金
インドネシア語	火
ベトナム語	月・水

ටෝකියෝ ප්‍රාදේශීය ආගමන විගමන කාර්යාංශය

දුරකතන: 0570-013904

දුරකතන: 03-5796-7112 (IP, විදේශීය)

විද්‍යුත් ලිපිනය : info-tokyo@i-moj.go.jp

◇විදේශිකයන් සඳහා වන ජාතික උපදේශන සහ උපකාරක මධ්‍යස්ථානය

〒160-0021

Tokyo-to, Shinjuku-ku, Kabuki-cho 2-44-1

Tokyo Health Center Hygeia 11F

Inside the Shinjuku Multicultural Plaza

දුරකතන: 03-3202-5535

ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව සදුදා-සිකුරාදා

පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව සදුදා, අඟහරුවාදා, බදාදා	
තග්ලොග් භාෂාව	සිකුරාදා
ඉන්දුනීසියානු භාෂාව	අඟහරුවාදා
වියට්නාම භාෂාව	සදුදා, බදාදා

在留資格の種類と在留期間

ජපානයේ රැඳී සිටීම් වර්ග සහ රැඳී සිටින කාල සීමාවන්

A.活動に着目して分類された在留資格

ක්‍රියාකාරකම් අනුව වර්ගීකරණය කරන ලද පදිංචි තත්වයන්

1. 就労が認められる在留資格

එක් එක් වර්ගය සඳහා තීරණය කර ඇති සීමාව තුළ වැඩ කිරීමට අවසර දෙන පදිංචි වර්ග

在留資格 පදිංචි තත්වයන්	在留期間 රැඳී සිටිය හැකි කාල සීමාව
			ඉංග්‍රීසි භාෂාව	සඳුදා, බ්‍රහස්පතින්දා, පෙ.ව. 10:00 ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව.3:00
			පෘතුගීසි භාෂාව	සඳුදා,බදාදා, සිකුරාදා: පෙ.ව. 10:00 ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව.3:00
			ස්පාඤ්ඤ භාෂාව	සඳුදා: පෙ.ව. 10:00 ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව.3:00
			චීන භාෂාව	බ්‍රහස්පතින්දා: පෙ.ව. 10:00 ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව.3:00
ハローワークプラザちば (Hello Work Plaza Chiba)	Chiba-shi Chuo-ku Shinmachi 3-13 Chiba TN bldg. 1F	043-238-8300	ජපන් භාෂාව	සඳුදා-සිකුරාදා: පෙ.ව. 10:15 - ප.ව. 7:00 දෙවනි සහ හතරවැනි සෙනසුරාදා: පෙ.ව. 10:00 - ප.ව. 5:00
マザーズハローワークちば (Mothers' Hello Work Chiba)	Chiba-shi Chuo-ku Shinmachi 3-13 Chiba TN bldg. 1F	043-238-8100	ජපන් භාෂාව	සඳුදා-සිකුරාදා: පෙ.ව. 10:15 - ප.ව. 7:00

名前 නම	住所 ලිපිනය	電話 දුරකතන	言語 භාෂා	時間 වේලාවන්
千葉南 (Chiba-Minami)	Chiba-shi Chuo-ku Minamicho 2-16-3 Kaikikan Soga Ekimae Bldg. 3F, 4F	043-300-8609	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
			චීන භාෂාව	අඟහරුවාදා: පෙ.ව.10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
			ඉංග්‍රීසි භාෂාව ස්පාඤ්ඤ භාෂාව	බ්‍රහස්පතින්දා: පෙ.ව.10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
ハローワークプラザ市原 (Hello Work Plaza Ichihara)	Ichihara-shi Sarashina 5-1-18	0436-23-6941	ජපන් භාෂාව	සදුදා, අඟහරුවාදා, බදාදා, සිකුරාදා: පෙ.ව.8:30 - ප.ව.5:00 සෙනසුරාදා: පෙ.ව. 8:30 - ප.ව.5:00
市川 (Ichikawa)	Ichikawa-shi Minami Yawata 5-11-21	047-370-8609	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
			ඉංග්‍රීසි භාෂාව චීන භාෂාව	බදාදා: පෙ.ව.10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
銚子 (Choshi)	Choshi-shi Chuocho 8-16	0479-22-7406	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
館山(Tateyama)	Tateyama-shi Yawata 815-2	0470-22-2236	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
木更津 (Kisarazu)	Kisarazu-shi Fujimi 1-2-1 SPARKLE CITY KISARAZU Bldg. 5F	0438-25-8609	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
佐原 (Sawara)	Katori-shi Kita 1-3-2	0478-55-1132	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
茂原 (Mobara)	Mobara-shi Takashidai 1-5-1 Mobara Chiho Godochosha Bldg. 1F	0475-25-8609	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
いすみ (Isumi)	Isumi-shi Ohara 8000-1	0470-62-3551	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
松戸 (Matsudo)	Matsudo-shi Matsudo 1307-1 Matsudo Bldg. 3F	047-367-8609	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15, පලවෙනි සහ තුන්වෙනි සෙනසුරාදා : පෙ.ව.10:00 - ප.ව.5:00
			ඉංග්‍රීසි භාෂාව	සදුදා, අඟහරුවාදා: පෙ.ව.10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
			චීන භාෂාව	බදාදා: ප.ව.1:00 - ප.ව.5:00
			පෘතුගීසි භාෂාව	සදුදා : පෙ.ව.10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
ハローワークプラザ柏 (Hello Work Plaza Kashiwa)	Kashiwa-shi Kashiwa 4-8-1 Kashiwa Higasi-guti Kaneko Bldg 3F	04-7166-8609	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව.10:15 - ප.ව.7:00
野田 (Noda)	Noda-shi Mizuki 2-6-1	04-7124-4181	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15

名前 නම	住所 ලිපිනය	電話 දුරකතන	言語 භාෂා	時間 වේලාවන්
船橋(Funabashi)	Funabashi-shi Minato-cho 2-10-17 (1st.bldg.) Funabashi-shi Hon-cho 2-1-1 Funabashi Square 21 bidg (2nd bldg.)	047-431-8287 (1st.bldg.) 047-420-8609 (2nd bldg.)	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව. 8:30 - ප.ව. 5:15
			චීන භාෂාව	සදුදා: පෙ.ව.10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
			ඉංග්‍රීසි භාෂාව පෘතුගීසි භාෂාව ස්පාඤ්ඤ භාෂාව	අඟහරුවාදා,බදාදා,සිකුරාදා: පෙ.ව.10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
成田 (Narita)	Narita-shi Karabe 3-4-2	0476-27-8609	ජපන් භාෂාව	සදුදා-සිකුරාදා: පෙ.ව.8:30 - ප.ව.5:15
			ඉංග්‍රීසි භාෂාව	අඟහරුවාදා,බ්‍රහස්පතින්දා: පෙ.ව.11:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
			ස්පාඤ්ඤ භාෂාව	අඟහරුවාදා: පෙ.ව.11:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
			පෘතුගීසි භාෂාව	අඟහරුවාදා, බ්‍රහස්පතින්දා: පෙ.ව.11:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
			චීන භාෂාව	සිකුරාදා: පෙ.ව.11:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00

◇東京外国人雇用サービスセンター

日本で就職を希望する外国人留学生の方、
専門的・技術的分野の在留資格の方の就職支援
を行う公共職業安定機関です。
*英語・中国語の通訳員が配置されていますが、
指定された日となりますので、通訳が必要な方は
予め電話でご確認ください。
時間：午前9:00-午後5:00（土・日・祝日及び年末
年始は休み）
所在地：〒160-0004東京都新宿区四谷1-6-1四
谷タワー13階
電話：03-5361-8722

https://jsite.mhlw.go.jp/tokyo-foreigner/

◇විදේශිකයන් සඳහා වන ටෝකියෝ රැකියා සේවා මධ්‍යස්ථානය

මෙය ජපානයේ සේවය කිරීමට කැමති විදේශික සිසුන් මෙන්ම විශේෂිත හෝ තාක්ෂණික ක්ෂේත්‍ර සඳහා පදිංචි තත්වයක් ඇති පුද්ගලයින් සඳහා වෘත්තීය සහය සපයන පොදු රැකියා ආරක්ෂණ කාර්යාලයකි.

* ඉංග්‍රීසි භාෂා සහ චීන භාෂා පරිවර්තකයන් සිටින නමුත් එම සේවාව ලබා ගත හැක්කේ නම් කරන ලද දිනවල දී පමණි. පරිවර්තන සේවා අවශ්‍ය නම්, කරුණාකර පළමුව දුරකතන ඇමතුමක් ලබා දෙන්න.

වේලාව: පෙ.ව. 9:00 - ප.ව. 5:00 (සෙනසුරාදා, ඉරිදා, රජයේ නිවාඩු සහ වර්ෂ අවසාන නිවාඩු දින හැර)

ස්ථානය: 13F Yotsuya Tower, 1-6-1, Yotsuya, Shinjuku-ku, Tokyo 160-0004

දුරකතන: 03-5361-8722

https://jsite.mhlw.go.jp/tokyo-foreigner/

◇新宿外国人雇用支援・指導センター

日本人の配偶者等、定住者などの就労に制限のない在留資格の方・アルバイトを希望する外国人留学生・就学生の方等の就職支援を行っています。
*英語・中国語の通訳員が配置されていますが、完全予約制ですので、通訳が必要な場合は必ず事前に電話で予約してください。
時間：午前8:30-午後5:15（土・日・祝日及び年末年始は休み）

所在地：〒160-8489東京都新宿区歌舞伎町2-42-10
ハローワーク新宿（歌舞伎町庁舎）1階
電話：03-3204-8609
https://jsite.mhlw.go.jp/tokyo-hellowork/var/rev0/0108/7719/201311115363.pdf

◇介護に携わる外国人のための支援センター
（千葉県外国人介護人材支援センター）

電話：0120-054-762
住所：千葉市中央区千葉港4-5
千葉県社会福祉センター1階

英語：火・木・土　午前10:00～午後6:00
ベトナム語：月・水・金　午前10:00～午後4:00
　　火・木　午前10:00～午後6:00
https://www.cfcc.jp/

◇創業・経営相談
（チャレンジ企業支援センター）

住所：千葉市美浜区中瀬2-6-1WBG　マリブイースト23F
電話：043-299-2907
月～金　午前9:00～午後5:00（祝日等は除く）
メール：kigyo@ccjc-net.or.jp

■ 労働契約の締結

日本で働く人は、国籍・性別を問わず、また入国管理法上、合法、違法を問わず原則として、日本の労働基準法、最低賃金法、労働安全衛生法、労働者災害補償保険法などが適用されます。

◇ෂින්ජුකු විදේශිකයන් සඳහා වන රැකියා ආධාර සහ මාර්ගෝපදේශන මධ්‍යස්ථානය

ජපන් ජාතිකයෙකුගේ කාලාත්‍රයන්, දීර්ඝ කාලීන පදිංචිකරුවන් වැනි, රැකියාවක නිරතවීම සඳහා සීමාවන් නොමැති අය සහ අර්ධකාලීන රැකියා කිරීමට කැමති විදේශීය සිසුන්, විදේශික පාසල් සිසුන් සඳහා රැකියා සහන ලබාදේ.

*ඉංග්‍රීසි භාෂා, චීන භාෂා පරිවර්තකයන් සිටින නමුත් වේලාවක් වෙන් කරවා ගැනීම් අවශ්‍ය වේ. ඔබට පරිවර්තකයෙකු අවශ්‍ය නම්, කරුණාකර දුරකතන ඇමතුමක් ලබා දී කලින් වෙන් කරවා ගන්න.
වේලාව: පෙ.ව. 8:30 - ප.ව. 5:15 (සෙනසුරාදා, ඉරිදා, රජයේ නිවාඩු සහ වර්ෂ අවසාන නිවාඩු හැර)

ස්ථානය:　〒160-8489 Tokyo-to, Shinjuku-ku, Kabuki-cho 2-42-10

හෙලෝ වර්ක් ෂින්ජුකු (කබුකිචෝ කාර්යාලය) පළමු මහල
දුරකතන: 03-3204-8609
https://jsite.mhlw.go.jp/tokyo-hellowork/var/rev0/0108/7720/20131111153627.pdf

◇විදේශීය සාත්තු සේවකයන් සඳහා වන උපකාර මධ්‍යස්ථාන
(විබා විදේශීය සාත්තු සේවක උපකාරක මධ්‍යස්ථානය)

දුරකතන: 0120-054-762
ලිපිනය : 4-5, Chiba Minato, Chuo-ku, Chiba-shi, Chiba
Chiba Prefectural Social Welfare Center 1F
ඉංග්‍රීසි භාෂාව: අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, සෙනසුරාදා පෙ.ව 10:00 - ප.ව 6:00
වියට්නාම භාෂාව : සඳුදා, බදාදා, සිකුරාදා පෙ.ව 10:00 - ප.ව 4:00
　　අඟහරුවාදා, බ්‍රහස්පතින්දා පෙ.ව 10:00 - ප.ව 6:00
https://www.cfcc.jp/

◇ආරම්භක සහ කළමනාකරණ උපදේශනය(අභියෝගාත්මක ව්‍යාපාර සහාය මධ්‍යස්ථානය)

ලිපිනය :Chiba-shi,Mihama-ku,Nakase,2-6-1 WBG Marive East 23F
දුරකතන: 043-299-2907
සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9:00 - ප.ව. 5:00(නිවාඩු දින හැර.)
විද්‍යුත් ලිපිනය : kigyo@ccjc-net.or.jp

■රැකියා කොන්ත්‍රාත්තු අත්සන් තැබීම

ජපානයේ රැකියාවක නිරත වෙන ඕනෑම පුද්ගලයෙකු ජාතිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව, එසේම එම පුද්ගලයා ආගමන විගමන නීතිවලට අනුකූලව සුදුසු තත්වයකින් ජපානයේ රැඳී සිටින්නේද නැද්ද යන්න නොසලකා පොදු රීතියක් ලෙස ජපානයේ කම්කරු ප්‍රමිති නීතිය, අවම වැටුප් නීතිය,

後日のトラブルを避けるため、労働契約を結ぶときは、労働条件を文書にしてもらうと良いでしょう。雇用者は、労働者に、次の労働条件を文書で明示するよう義務付けられています。

①労働の契約期間
②契約更新の基準
③仕事をする場所、仕事の内容
④仕事を始める時刻と終わりの時刻、決められた労働時間を超える労働の有無、休憩時間、休日、休暇など
⑤賃金の決定、計算及び支払いの方法、賃金の締切り及び支払いの時期、昇給に関すること
⑥退職に関すること

කම්කරු ආරක්ෂාව සහ සෞඛ්‍ය නීතිය, කම්කරු පුද්ගලික අනතුරු වන්දි රක්ෂණ පනත සියලුම දෙනාට අදාළ වේ.
රැකියා කොන්ත්‍රාත්තුවකට එළඹීමේදී, පසු කාලීනව ඇති විය හැකි ගැටළු අවම කර ගැනීම සඳහා, සේවා කොන්දේසි ලේඛනගත කර ලබා ගැනීම සුදුසුය. පහත සඳහන් සේවා කොන්දේසි ලිඛිතව පැහැදිලිව ප්‍රකාශ කිරීමට සේවා යෝජකයින් කම්කරුවන්ට බැඳී සිටී.

①කම්කරු කොන්ත්‍රාත් කාලය
②කොන්ත්‍රාත්තුව අලුත් කිරීම සඳහා වන නිර්ණායක
③රැකියා ස්ථානය සහ අන්තර්ගතය
④රැකියා ආරම්භයේ සිදු වන ප්‍රමාදයන් සහ අවසන් කිරීමේ කිරීමේදී සිදුවන ප්‍රමාදයන්, නියමිත වේලාවට වඩා වැඩි කාලයක් රැකියා කිරීම හෝ නොකිරීම, විවේක කාලය, නිවාඩු දින ආදිය
⑤වැටුප් තීරණය කිරීම, ගණනය කිරීම සහ ගෙවීමේ ක්‍රම, වැටුප් කාල සීමාවන්, ගෙවීම් කාලය සහ වැටුප් වැඩිවීම් සම්බන්ධ කරුණු
⑥විශ්‍රාම ගැනීම සම්බන්ධ කරුණු

■ 労働相談

賃金・労働時間・安全衛生・労働災害に対する補償などのトラブルの相談は、最寄りの労働局又は労働基準監督署でお答えしています。

◇千葉労働局労働基準部監督課

外国人のための労働相談窓口を開設しています。
時間:(英語での相談日) 火・木曜日
午前9:30-午後12:00　午後1:00-午後5:00
*事前にお問い合わせください。
所在地:千葉市中央区中央4-11-1千葉第2地方合同庁舎
電話:043-221-2304

◇労働基準監督署

千葉県内の労働基準監督署でも相談を受け付けています。
月～金　午前8:30～午後5:15
外国語で相談を受け付けているところもあります。
下の表をご参照ください。

■රැකියා සඳහා වන උපදේශනය

වැටුප, වැඩ කරන කාලය, ආරක්ෂාව සහ සෞඛ්‍යය, රැකියා ආශ්‍රිත අනතුරු සඳහා වන්දි යනාදිය පිළිබඳ උපදෙස් සඳහා ළඟම ඇති කම්කරු කාර්යාංශය හෝ කම්කරු ප්‍රමිති පරීක්ෂණ කාර්යාලය අමතන්න.

◇විබා කම්කරු කාර්යාංශය, කම්කරු ප්‍රමිති දෙපාර්තමේන්තුව, අධීක්ෂණ අංශය

විදේශිකයන් සඳහා කම්කරු උපදේශන සේවාවක් විවෘත කර ඇත.
වේලාව: (ඉංග්‍රීසි භාෂා උපදේශනය) අහඹරුවාදා සහ බ්‍රහස්පතින්දා
පෙ.ව. 9:30 - ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව. 5:00*කලින් වෙන් කරවා ගැනීම අවශ්‍යයි.
ස්ථානය: Chiba Daini Chiho Godochosha Bldg. 4-11-1, Chuo-ku, Chiba
දුරකතන: 043-221-2304

◇කම්කරු ප්‍රමිති අධීක්ෂණ කාර්යාලය

විබා ප්‍රාන්තයේ කම්කරු ප්‍රමිති පරීක්ෂණ කාර්යාලයෙන් ද උපදේශනය ලබා ගත හැකිය.
සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 8:30 - ප.ව. 5:15
විදේශ භාෂා උපදේශනය ඇතැම් කාර්යාල වලදී ලබා ගත හැකිය.
කරුණාකර පහත ලැයිස්තුව බලන්න.

労働基準監督署

කම්කරු ප්‍රමිති අධීක්ෂණ කාර්යාලය

名前 නම	住所 ලිපිනය	電話 දුරකතන	日本語以外の言語 විදේශ භාෂා	実施日 දිනය
千葉 (Chiba)	Chiba-shi Chuo-ku Chuo 4-11-1 Chiba Daini Chiho Godochosha	043-221-2304	ඉංග්‍රීසි භාෂාව	අඟහරුවාදා, බ්‍රහස්පතින්දා
船橋 (Funabashi)	Funabashi-shi Kaijin-cho 2-3-13	047-431-0182	චීන භාෂාව	බ්‍රහස්පතින්දා, සිකුරාදා
柏 (Kashiwa)	Kashiwa-shi Chuo-cho 3-2	04-7163-0246	චීන භාෂාව	බදාදා, සිකුරාදා
			වියට්නාම භාෂාව	අඟහරුවාදා, බ්‍රහස්පතින්දා
銚子 (Choshi)	Choshi-shi Chuo-cho 8-16	0479-22-8100		
木更津 (Kisarazu)	Kisarazu-shi Fujimi 2-4-14 Kisarazu Chiho Godochosha	0438-22-6165		
茂原 (Mobara)	Mobara-shi Hagiwara-cho 3-20-3	0475-22-4551		
成田 (Narita)	Narita-shi Towada 553-4	0476-22-5666		
東金 (Togane)	Togane-shi Tama 65	0475-52-4358		

◇外国人労働者向け相談ダイヤル
（厚生労働省）

労働条件に関する問題について、法令の説明や各関係機関の紹介を行っています。
英語、中国語、ポルトガル語、スペイン語、タガログ語、ベトナム語、ミャンマー語、ネパール語、韓国語、タイ語、インドネシア語、カンボジア語、モンゴル語に対応しています。
各言語の電話番号とスケジュールについては URL をご参照ください。

http://www.check-roudou.mhlw.go.jp/soudan/foreigner.html

◇විදේශීය සේවකයින් සඳහා උපදේශන සේවා ලබා දෙන දුරකතන අංකය
(සෞඛ්‍ය, කම්කරු හා සුබසාධන අමාත්‍යාංශය)

සේවා කොන්දේසි සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් නීති සහ ආඥාපනත පැහැදිලි කිරීම සහ අදාළ ආයතන වෙත හඳුන්වා දෙනු ලබයි.
එම සේවාව භාෂා කීපයකින් ලබා ගත හැකිය. (ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, තග්ලොග් භාෂාව, වියට්නාම භාෂාව, බුරුම භාෂාව, නේපාල භාෂාව, කොරියානු භාෂාව, තායි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, කාම්බෝජියන් භාෂාව, මොන්ගෝලියානු භාෂාව)
සියලුම භාෂාවන්හි දුරකතන අංක සහ කාල සටහන් ලබා ගැනීම සඳහා පහත වෙබ් සබැඳිය භාවිත කරන්න.

http://www.check-roudou.mhlw.go.jp/soudan/foreigner.html

◇労働条件ほっとライン
（厚生労働省）

労働局や労働基準監督署が閉まっているときの相談窓口です、全国どこからでも無料で通話できます。
英語、中国語、ポルトガル語、スペイン語、タガログ語、ベトナム語、ミャンマー語、ネパール語、韓国語、

◇කම්කරු කොන්දේසි ක්ෂණික ඇමතුම්
(සෞඛ්‍ය, කම්කරු හා සුබසාධන අමාත්‍යාංශය)

කම්කරු කාර්යාංශය සහ කම්කරු ප්‍රමිති පරීක්ෂණ කාර්යාලය වසා ඇති විට උපදේශන සේවාව ඔබට ජපානයේ ඕනෑම තැනක සිට නොමිලේ ලබාගත හැකිය.
ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, තග්ලොග් භාෂාව, වියට්නාම භාෂාව, බුරුම භාෂාව, නේපාල භාෂාව, කොරියානු භාෂාව, තායි

語、タイ語、インドネシア語、カンボジア語、モンゴル語に対応しています。各言語の電話番号とスケジュールについては URL をご参照ください。

http://www.check-roudou.mhlw.go.jp/soudan/foreigner.html

■ 労働保険制度

日本には労働者を保護する労働者災害補償保険(労災保険)と雇用保険の二つの制度があります。

◇労災保険

労災保険は、仕事でけがをしたり、病気になった場合や、過労死、通勤の途中でけがをした場合などに、療養補償、休業補償、障害補償、遺族補償などの給付金を受けることができます。これらの補償は、本人又は家族からの請求に基づき、労働基準監督署が調査し、決定します。保険料は雇用主が支払います。詳しくは、労働基準監督署へお問い合わせください。

・外国人向け労災給付パンフレット（厚生労働省）

英語、ポルトガル語、韓国語、中国語、ベトナム語、タイ語、インドネシア語、ペルシア語、スペイン語、タガログ語、カンボジア語、ネパール語、ミャンマー語

https://www.mhlw.go.jp/new-info/kobetu/roudou/gyousei/rousai/gaikoku-pamphlet.html

◇雇用保険

雇用保険は、労働者が失業した場合に、次の仕事に就くまでの一定期間、必要な給付を行うものです。保険料は雇用主と労働者が支払います。詳しくは、ハローワーク(→P50)にお問い合わせください。

■ 年金制度

（国民年金・厚生年金保険）

日本では、年をとったり、傷病で障害者になったり、生計を維持する者が亡くなったときなどに生活の安定を図るため、すべての国民が年金に加入することになっています。

හාෂාව, ඉන්දුනීසියානු භාෂාව, කාම්බෝජියානු භාෂාව, මොන්ගෝලියානු භාෂාව යන භාෂා වලින් එම සේවාව ලබා ගත හැකිය. එක් එක් භාෂාව සඳහා වන දුරකථන අංක සහ කාලසටහන් සඳහා කරුණාකර පහත සබැඳිය වෙත යොමු වන්න.

http://www.check-roudou.mhlw.go.jp/soudan/foreigner.html

■ ශ්‍රමික රක්ෂණ පද්ධතිය

ජපානයේ ශ්‍රමිකයන් ආරක්ෂා කිරීම සඳහා සේවක අනතුරු වන්දි රක්ෂණය (ශ්‍රමික වන්දි රක්ෂණය) සහ රැකියා රක්ෂණය ලෙස පද්ධති දෙකක් තිබේ.

◇ශ්‍රමික වන්දි රක්ෂණය

ශ්‍රමික වන්දි රක්ෂණය මගින් රැකියාවේදී ඇති විය හැකි තුවාල, අසනීප, අධික වැඩ නිසා සිදුවන මරණ, සහ ගමනාගමනයේදී සිදුවන මරණ යනාදි අවස්ථා වලදී වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන්දි, නිවාඩු වන්දි, ආබාධිත වන්දි, අහිමි වූ පවුල් වන්දි වැනි ප්‍රතිලාභ ඔබට ලැබිය හැකිය. මෙම වන්දි, ශ්‍රමිකයාගේ හෝ ඔහුගේ/ඇයගේ පවුලේ අයගේ හිමිකම් මත පදනම්වකම්කරු ප්‍රමිතීන් අධීක්ෂණ කාර්යාලය විමර්ශනය කර තීරණය කරනු ඇත. රක්ෂණ වාරික ගෙවනු ලබන්නේ සේවායෝජකයා විසිනි. වැඩි විස්තර සඳහා කරුණාකර කම්කරු ප්‍රමිති පරීක්ෂණ කාර්යාලය අමතන්න.

・විදේශිකයන් සඳහා කම්කරු වන්දි පිලිබඳ පත්‍රිකාව (සෞඛ්‍ය, කම්කරු හා සුබසාධන අමාත්‍යාංශය)

ඉංග්‍රීසි භාෂාව, පෘතුගීසි භාෂාව, කොරියානු භාෂාව, චීන භාෂාව, වියට්නාම භාෂාව, තායි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, පර්සියානු භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, තග්ලොග් භාෂාව, කාම්බෝජ භාෂාව, නේපාල භාෂාව සහ බුරුම භාෂාව.

https://www.mhlw.go.jp/new-info/kobetu/roudou/gyousei/rousai/gaikoku-pamphlet.html

◇රැකියා රක්ෂණය

මෙම රැකියා රක්ෂණය යනු ශ්‍රමිකයන් රැකියා විරහිත වූ විට ඊළඟ රැකියාව ලැබෙන තුරු නිශ්චිත කාලයක් සඳහා අවශ්‍ය ප්‍රතිලාභ ලබා දෙන ක්‍රමයකි. රක්ෂණ වාරික ගෙවනු ලබන්නේ සේවා යෝජකයින් සහ ශ්‍රමිකයන් විසිනි. විස්තර සඳහා, කරුණාකර හෙලෝ වර්ක් (→P50) අමතන්න.

■ විශ්‍රාම වැටුප් ක්‍රමය

(ජාතික විශ්‍රාම වැටුප්, සුබසාධන විශ්‍රාම වැටුප් රක්ෂණය)

ජපානයේ සෑම අයෙකුම වයස්ගත වීම, තුවාල හෝ අසනීප හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් වීම සහ තම යැපෙන්නා මියයාමක දී ස්ථාවර ජීවිතයක් ගත කිරීම සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයකට ඇතුළත් විය යුතුය.

・国民年金制度のしくみ（日本年金機構）

日本語、英語、中国語、韓国語、ポルトガル語、スペイン語、インドネシア語、タガログ語、タイ語、ベトナム語、ミャンマー語、カンボジア語、ロシア語、ネパール語、モンゴル語

http://www.nenkin.go.jp/pamphlet/kokunenseido.html

◇国民年金

国民年金には 20歳から 60歳未満の人が加入します。

国民年金の加入申請は、パスポート又は在留カードを持って、市区町村役所の年金担当課で手続きをします。保険料は、月額16,980円(2024年現在)です。一定の要件により、各基礎年金が支給されます。

会社や工場に勤めていて厚生年金保険に加入している方は雇用主が手続きをします。

*保険料は、毎年変更されます。

◇厚生年金保険

健康保険の適用事務所で働いている人は、この年金に加入しなければなりません。保険料は、給料の一部が毎月の給料から引かれ、事業主はあなたの給料から差し引いた金額と同額を合わせて社会保険事務所に支払います。また、ボーナスを受けたときも保険料を支払います。

一定の要件により、各厚生年金が支給されます。

https://www.nenkin.go.jp/service/pamphlet/kaigai/konen-kenpo.html

◇短期在留外国人の脱退一時金

日本国籍を有しない方が、国民年金、又は厚生年金保険の被保険者資格を喪失し、日本を出国した場合、日本に住所を有しなくなった日から 2年以内に脱退一時金を請求することができます。

日本語、英語、中国語、韓国語、ポルトガル語、スペイン語、インドネシア語、タガログ語、タイ語、ベトナム語、ミャンマー語、カンボジア語、ロシア語、ネパール語、モンゴル語

https://www.nenkin.go.jp/international/japanese-system/withdrawalpayment/payment.html

・ජපන් විශ්‍රාම වැටුප් සේවාව (ජපන් ජාතික විශ්‍රාම වැටුප් පද්ධතිය)

ජපන් භාෂාව, ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, තග්ලොග් භාෂාව, තායි භාෂාව, වියට්නාම භාෂාව, බුරුම භාෂාව, කාම්බෝජ භාෂාව, රුසියානු භාෂාව, නේපාල භාෂාව සහ මොන්ගෝලියානු භාෂාව.

http://www.nenkin.go.jp/pamphlet/kokunenseido.html

◇ජාතික විශ්‍රාම වැටුප් සැලැස්ම

වයස අවුරුදු 20 ත් 60 ත් අතර පුද්ගලයින් ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් වේ.

ජාතික විශ්‍රාම වැටුප සඳහා අයදුම් කිරීමට, ඔබගේ විදේශ ගමන් බලපත්‍රය හෝ පදිංචි කාඩ්පත රැගෙන නාගරික කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංශය වෙත යන්න. එහිදී ඒ සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය සිදු කෙරෙයි. රක්ෂණ වාරිකය මසකට ජපන් යෙන් 16,980 කි (2024 වන විට). සෑම මූලික විශ්‍රාම වැටුපක්ම යම් කොන්දේසි වලට අනුව ගෙවනු ලැබේ.

සමාගමක හෝ කර්මාන්ත ශාලාවක සේවය කර සුබසාධන විශ්‍රාම වැටුප් රක්ෂණයට ලියාපදිංචි වී සිටින පුද්ගලයින් සම්බන්ධව සේවායෝජකයා විසින් ක්‍රියා පටිපාටිය සම්පූර්ණ කරනු ඇත.

*රක්ෂණ වාරික සෑම වසරකම වෙනස් වීමට ලක්වේ.

◇සේවක විශ්‍රාම රක්ෂණය

සෞඛ්‍ය රක්ෂණයෙන් ආවරණය වන කාර්යාලවල සේවය කරන පුද්ගලයින් මෙම විශ්‍රාම වැටුප් සැලැස්මට ඇතුළත් විය යුතුය. ඔබේ වැටුපෙන් කොටසක් රක්ෂණ වාරික සඳහා අඩු කරනු ලබයි.ඔබ ව්‍යාපාර හිමිකරුවෙකු නම් ඔබගේ වැටුපෙන් අඩු කරන ලද මුදලට සමාන මුදලක් එකතු කිරීමෙන් සමාජ රක්ෂණය කාර්යාලයට ගෙවීම සිදු කරන්න. එසේම, ඔබට ප්‍රසාද දීමනාවක් ලැබුණු විට, රක්ෂණ වාරික ගෙවීමට සිදුවනු ඇත.

සෑම සුබසාධන විශ්‍රාම වැටුපක්ම ගෙවනු ලබන්නේ යම් කොන්දේසි වලට අනුවය.

https://www.nenkin.go.jp/service/pamphlet/kaigai/konen-kenpo.html

◇කෙටි කාලීන විදේශීය පදිංචිකරුවන් සඳහා තාවකාලික ආපසු ගැනීමේ ගාස්තුව

විදේශිකයන් හට ජාතික විශ්‍රාම වැටුප් හෝ සුබසාධක විශ්‍රාම වැටුප් රක්ෂණය සඳහා සුදුසුකම් නිමි නොවී, ඔබ ජපානයෙන් පිටව ගියහොත් ඔබට ජපානයේ ලිපිනයක් නොමැති වූ දින සිට වසර 2ක් ඇතුළත තාවකාලික ආපසු ගැනීමේ ගෙවීමක් සඳහා අයදුම් කළ හැකිය.

ජපන් භාෂාව, ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, තග්ලොග් භාෂාව, තායි භාෂාව, වියට්නාම භාෂාව, බුරුම භාෂාව, කාම්බෝජ භාෂාව, රුසියානු භාෂාව, නේපාල භාෂාව සහ මොන්ගෝලියානු භාෂාව

https://www.nenkin.go.jp/international/japanese-system/withdrawalpayment/payment.html

年金事務所

විශ්‍රාම වැටුප් කාර්යාලය

[開庁時間] [රාජකාරී වේලාවන්]

月曜日 - 金曜日　午前8時30分から午後5時15分　　සඳුදා සිට සිකුරාදා දක්වා　පෙ.ව. 8:30 - ප.ව. 5:15

名前 නම	英語 ඉංග්‍රීසි භාෂාව	住所 ලිපිනය	電話 දුරකතන
千葉年金事務所	Chiba Pension Office	Chiba-shi Chuo-ku Chuoko 1-17-1	043-242-6320
千葉年金事務所 茂原分室	Mobara Branch, Chiba Pension office	Mobara-shi Chiyoda-cho 1-6	0475-23-2530
幕張年金事務所	Makuhari Pension Office	Chiba-shi Hanamigawa-ku Makuhari Hongo 1-4-20	043-212-8621
船橋年金事務所	Funabashi Pension Office	Funabashi-shi Ichiba 4-16-1	047-424-8811
市川年金事務所	Ichikawa Pension Office	Ichikawa-shi Ichikawa 1-3-18 Ichikawa Grand Hotel Do Bldg.	047-704-1177
松戸年金事務所	Matsudo Pension Office	Matsudo-shi Shin Matsudo 1-335-2	047-345-5517
木更津年金事務所	Kisarazu Pension Office	Kisarazu-shi Shinden 3-4-31	0438-23-7616
佐原年金事務所	Sawara Pension Office	Katori-shi Sawara Ro 2116-1	0478-54-1442
佐原年金事務所 成田分室	Narita Branch, Sawara Pension office	Narita-shi hanazaki-cho 828-11	0476-24-5715

・通訳サービス （窓口のみ）

受付時間　月～金　午前8:30 - 午後5:15

対応言語

英語、中国語、韓国語、ポルトガル語、スペイン語、インドネシア語、タガログ語、タイ語、ベトナム語、ネパール語、ミャンマー語

https://www.nenkin.go.jp/international/index.html

・පරිවර්තන සේවාව (කාර්යාලයට පැමිණෙන අය සඳහා පමණි)

රාජකාරී වේලාවන්: සඳුදා-සිකුරාදා පෙ.ව. 8:30 – ප.ව. 5:15

භාෂා:

ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, පෘතුගීසි භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, තග්ලොග් භාෂාව, තායි භාෂාව, වියට්නාම භාෂාව සහ නේපාල භාෂාව, මියන්මාර භාෂාව

https://www.nenkin.go.jp/international/index.html

7 住まい

නිවාස

■ 家やアパートを借りるとき

◇民間の住宅を借りる場合

通常、不動産会社を通じて住宅(貸家、アパート)を紹介してもらいます。契約時には、保証人を立てたり、家賃以外の必要経費を支払うなど、特別な手続きがとなる場合があります。契約書や重要事項説明書の内容をよく確認して契約することが大切です。

・部屋探しのガイドブック(国土交通省)

部屋の探し方、契約の手続き、入居後の注意点など、日本で部屋探しをする上での基礎知識が掲載されています。
日本語、英語、中国語、韓国語、スペイン語、ポルトガル語、ベトナム語、ネパール語、タイ語、インドネシア語、ミャンマー語、カンボジア語、タガログ語、モンゴル語

http://www.mlit.go.jp/jutakukentiku/house/jutakukentiku_house_tk3_000017.html

・「外国人のための賃貸住宅入居の手引き」(日本で部屋探しをする外国人の方へ)(国土交通省)

日本で部屋探しをするときに活用できる基本的な情報や、外国語で対応できる不動産のウェブサイトなどをやさしい日本語で紹介しています。

http://www.mlit.go.jp/jutakukentiku/house/jutakukentiku_house_tk3_000017.html

・千葉県外国人学生住居アドバイザー

「外国人学生住居アドバイザー」のステッカーを貼ってある不動産会社は、外国人学生に住宅に関する情報提供や助言をします。
千葉県のホームページに一覧表を掲載していますので、ご活用ください。

https://www.pref.chiba.lg.jp/kokusai/soudan/gaikokujin/gakuseijuukyo.html

■ නිවාස හෝ මහල් නිවාස කුලී පදනම් මත ගැනීම

◇පෞද්ගලික නිවාස කුලියට ගැනීමකදී

සාමාන්‍යයෙන්, දේපල සමාගමක් හරහා ඔබට නිවාස (කුලී නිවාස, මහල් නිවාස) හඳුන්වා දෙනු ලැබේ. කොන්ත්‍රාත්තුව අත්සන් කරන අවස්ථාවේදී, ඇපකරුවෙකු ඉදිරිපත් කිරීම, නිවාස කුලිය හැර වෙනත් අමතර ගෙවීම් සිදු කළ යුතු අවස්ථා නිබිය හැකිය. කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමට පෙර කොන්ත්‍රාත්තුවේ අන්තර්ගතය සහ අනෙකුත් අත්‍යවශ්‍ය කරුණු කියවා තහවුරු කර ගැනීමෙන් පසුව අත්සන් තබන්න.

▪කාමර සෙවීම් මාර්ගෝපදේශ පොත (ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය)

මෙහි ජපානයේ කුලී කාමරයක් සොයාගන්නේ කෙසේද, කොන්ත්‍රාත්තුවක් සම්පූර්ණ කරන්නේ කෙසේද, පදිංචියට ගිය පසු අවධානය යොමු කළ යුතු කරුණු සම්බන්ධව තොරතුරු ලැයිස්තුගත කර ඇත.
ජපන් භාෂාව, ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, පෘතුගීසි භාෂාව, වියට්නාම භාෂාව, නේපාල භාෂාව, තායි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, බුරුම භාෂාව, කාම්බෝජ භාෂාව, තග්ලොග් භාෂාව සහ මොන්ගෝලියානු භාෂාව.

http://www.mlit.go.jp/jutakukentiku/house/jutakukentiku_house_tk3_000017.html

• "විදේශිකයන් සඳහා කුලී කාමර සෙවීම් මාර්ගෝපදේශ" (ජපානයේ විදේශිකයන් සඳහා වන කුලී කාමර සෙවීම) (ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යාංශය)

ජපානයේ කුලී කාමරයක් සොයන විට භාවිතා කළ හැකි මූලික තොරතුරු සහ විදේශ භාෂාවලින් ප්‍රතිචාර දක්වන දේපල වෙළඳාම් වෙබ් අඩවි සරල ජපන් භාෂාවෙන් හඳුන්වා දී ඇත.

http://www.mlit.go.jp/jutakukentiku/house/jutakukentiku_house_tk3_000017.html

▪චිබා ප්‍රාන්ත විදේශ ශිෂ්‍ය අධ්‍යයන නේවාසික උපදේශක

"විදේශීය ශිෂ්‍ය නිවාස උපදේශක" ස්ටිකරයක් සහිත දේපල වෙළඳාම් සමාගම් විදේශීය සිසුන් සඳහා නිවාස සම්බන්ධ තොරතුරු සහ උපදෙස් ලබා දෙයි.

චිබා ප්‍රාන්තයේ වෙබ් අඩවියේ ලැයිස්තුවක් පළ කර ඇත. කරුණාකර එය භාවිතා කරන්න.

https://www.pref.chiba.lg.jp/kokusai/english/information/residents/students.html

◇公営住宅を借りる場合

県や市町村が賃貸している住宅は、申込みの期間が決められています。
入居資格条件があることや空き家があることが必要になるため、申込みをしてもすぐには入居できないことがあります。
また、都市再生機構でも賃貸住宅を貸しています。
詳しいことはそれぞれ管理しているところに問い合わせてください。

・市町村営住宅: 各市町村役所

・県営住宅:
千葉県住宅供給公社　県営住宅管理部
電話:043-222-9200

・公団住宅: 独立行政法人　都市再生機構
https://www.ur-net.go.jp/

◇貸家やアパートの概要

①住居の種類:貸家、アパート、マンション、下宿などがあります。
②間取り:部屋の数と L(居間)・D(食堂)・K(台所)を組み合わせて 2LDK、3LDK などと表示します。部屋の広さは、畳の枚数で表示していることもあります。一畳は約1.8m×0.9m です。

③設備は、電気・水道・ガスなどは備えられていますが、使用する前の手続きは入居者が行います。

◇必要な経費

契約時には、家賃、共益費(管理費)、敷金、礼金、手数料の合計金額を払います。

①家賃:月ごとに前払いで支払います。
②共益費:階段や通路などの共用部分の電気代、清掃費などです。
③敷金:家賃の滞納や部屋の損傷に対する補償金として家主に預けるお金で、家賃の 1～2 か月分程度です。引越しのとき部屋の修理代を

◇පොදු නිවාස කුලියට ගැනීමේදී

ප්‍රාන්ත සහ මහ නගර සභා විසින් කුලී පදනම් මත ලබා දෙන නිවාස සඳහා අයදුම් කල හැකි කාල සීමාවක් ඇත.
පදිංචි වීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලීම සහ කුලියට ලබා දිය හැකි නිවසක් ඔවුන් සතුව පැවතීම අවශ්‍ය වන බැවින් අයදුම් කළ වහාම නිවසක් ලබා ගැනීම අසීරු විය හැකිය.
නාගරික පුනර්ජීවන සංවිධානය ද කුලී පදනම් මත නිවාස ලබා දෙයි.වැඩි විස්තර සඳහා කරුණාකර පරිපාලන කාර්යාලයෙන් විමසන්න.

▪නාගරික කළමණාකරන නිවාස: සෑම නගර සභා කාර්යාලයක්ම

•ප්‍රාන්ත කළමණාකරණ නිවාස:
විබා ප්‍රාන්ත නිවාස සම්පාදන සංස්ථාව
ප්‍රාන්ත නිවාස කළමනාකරණ දෙපාර්තමේන්තුව
දුරකථනය: 043-222-9200

•පොදු සංස්ථා නිවාස: ස්වාධීන පරිපාලන සංස්ථාව
නාගරික පුනර්ජීවන ඒජන්සිය
https://www.ur-net.go.jp/

◇කුලී නිවාස සහ කුලී කාමර විස්තරය

①නිවාස වර්ග: කුලී නිවාස, කුලී කාමර, මහල් නිවාස, නේවාසික නිවාස (බෝඩිම්) ආදිය තිබේ.
②නිවාස පිරිසැලසුම: කාමර ප්‍රමාණය සහ L (විසිත්ත කාමරය), D (කෑම කාමරය) සහ K (මුළුතැන්ගෙය) සමඟ ඒකාබද්ධ වූ කාමර එය 2LDK, 3LDK, යනාදිය ලෙස දක්වනු ලැබේ. කාමරයක විශාලත්වය සමහර විට “තතමි” නම් වූ සන පැදුරු ප්‍රමාණය අනුව දක්වා ඇති අවස්ථාද වේ. එක් “තතමි” පැදුරක් මීටර් 1.8 x 0.9 ක් පමණ වේ.
③විදුලිය, ජලය, ගෑස් ආදී පහසුකම් සපයා ඇතත් ඒවා භාවිතා කිරීමට පෙර ඒවා සම්බන්ධ කිරීම අවශ්‍ය වේ. මෙයනිවසේ භාරකරු විසින් මෙය සිදු කර දෙනු ලැබේ.

◇ගාස්තුව

කොන්ත්රාත්තුවේ දී, මාසික කුලිය, පොදු සේවා ගාස්තු (කළමනාකරණ ගාස්තු), ආරක්ෂක තැන්පතු ගාස්තු, අත්තිකාරම් ගාස්තු, තැරැව්කාර ගාස්තු යන සියලුම ගාස්තු ගෙවිය යුතුය.

①මාසික කුලිය :මාසික ගෙවීම අදාළ මාසයට පෙර කළ යුතුය.
②කළමනාකරණ සේවා ගාස්තු:පඩිපෙළ සහ කොරිඩෝ වැනි පොදු ප්‍රදේශ සඳහා විදුලිය සහ පිරිසිදු කිරීමේ ගාස්තු ආවරණය කර ගැනීම සඳහා.
③ආරක්ෂක තැන්පතු ගාස්තු: මාසික කුලිය නොගෙවීම් හෝ කාමරයට හානි කිරීමක් සඳහා වන්දි වශයෙන් ඉඩම් හිමියාට ලබා දෙන ආරක්ෂක තැන්පතු ගාස්තුවකි. එය බොහෝවිට මාස 1-2 ක කුලී ගාස්තුව හා සමාන වේ. ඔබ

差し引いて残りがあれば返金されます。

④礼金：契約成立時に家主に謝礼として払うお金で、家賃の 1～2 か月分程度であり、返金されません。

⑤仲介手数料：通常、不動産会社に払います。家賃の 1 か月分以内です。

◇注意事項

①契約時には保証人が必要な場合があります。保証人がいないときは、保証会社を利用できる場合があります。

②家主の許可なく住宅（部屋）の改装はできません。

③契約時に決めた借家人以外の人と一緒に住むことはできません。

④通常、契約期間は 2年です。2年経つと契約の更新をしなければなりませんが、その際、家賃が変更されることもあります。

■電気・ガス・水道

◇電気

千葉県の電力は 50Hz100 V です。周波数、電圧の違う電気器具は調整が必要です。

入居して電気を初めて使用するときは、ブレーカーのスイッチをオンにして電気を通します。電気が来ていることを確認し、住居に備え付けてある「電気使用申込書」に名前、入居日などを記入し電力事業者へ送ります。

電気料金の支払いは、銀行又は郵便局の口座から自動振替にするか、所定の振込票（入金フォーム）により銀行・郵便局・コンビニエンスストアなどから支払います。

引越しするときは電気を止めるので、前もって、電力事業者に連絡します。

◇ガス

日本には都市ガスとプロパンガスの 2種類のガスがあります。ガスの種類に合ったガス器具を使う必要

කාමරයෙන් ඉවත්ව වෙනත් ස්ථානයකට මාරු වීමේදී කාමරය අලුත්වැඩියා කිරීමේ පිරිවැය අඩු කිරීමෙන් පසු යමක් මුදලක් ඉතිරිව තිබේ නම්, එය ආපසු ඔබට ගෙවනු ලැබේ.

④අත්තිකාරම් ගාස්තු: කොන්ත්‍රාත්තුව අත්සන් කරන විට කෘතඥවීමක් ලෙස ඉඩම් හිමියාට ගෙවනු ලබන මුදල් වේ. මාසික කුලී ගාස්තු 1-2 කට සමාන වන අතර එය ආපසු ඔබට නොලැබේ.

⑤තැරැව්කාර ගාස්තු: සාමාන්‍යයෙන් දේපල වෙළඳාම් සමාගමට ගෙවනු ලැබේ. එය මාසයක කුලිය තුළ ඇත.

◇සටහන්

①කොන්ත්‍රාත්තුව අත්සන් කරන අවස්ථාවේදී ඇපකරුවෙකු අවශ්‍ය විය හැක. ඔබට ඇපකරුවෙකු නොමැති නම්, ඇපකාර සමාගමක් භාවිතා කළ හැකිය.

②ඉඩම් හිමියාගේ අවසරයකින් තොරව නිවස (කාමරය) අලුත්වැඩියා කිරීමට අවසර නැත.

③කොන්ත්‍රාත්තුව අත්සන් කරන අවස්ථාවේ තීරණය කරන ලද කුලී නිවැසියෙකු හැර වෙනත් කිසිවෙකු සමඟ ඔබට එහි ජීවත් විය නොහැක.

④සාමාන්‍ය කොන්ත්‍රාත් කාලය වසර දෙකකි. වසර දෙකකට පසු, ඔබ කොන්ත්‍රාත්තුව අලුත් කළ යුතුය. නමුත් එම අවස්ථාවේදී මාසික කුලිය වෙනස් විය හැක.

■ විදුලිය, ගෑස්, ජලය

◇විදුලිය

ඩිබා ප්‍රාන්තයේ විදුලිය බල ප්‍රමාණය 50Hz සහ 100V වේ. විවිධ සංඛ්‍යාත සහ වෝල්ටීයතා සහිත විදුලි උපකරණ සකස් කරගැනීම අවශ්‍ය වේ.

ඔබ නිවසක පදිංචියට ගොස් ප්‍රථම වරට විදුලිය භාවිතා කරන විට, බ්‍රේකර් ස්විචය ක්‍රියාත්මක කරන්න. විදුලිය ලැබෙන බව තහවුරු කර ගැනීමෙන් පසු ඔබගේ නිවසේ ලබා දී ඇති "විදුලිය භාවිත ඉල්ලුම්පත්‍රය" මත ඔබගේ නම, පදිංචියට යන දිනය යනාදිය සම්පූර්ණ කර විදුලි බල මණ්ඩලයට යවන්න.

විදුලි ගාස්තු ගෙවීම බැංකුවකින් හෝ තැපැල් කාර්යාල ගිණුමකින් ස්වයංක්‍රීයව ගෙවිය හැක.එසේ නැතිනම් බැංකුවකින්, තැපැල් කාර්යාලයකින්, හෝ පැය 24ම විවෘත වෙළඳ සලකින් ඉන්වොයිසයක් (ගෙවීම් පෝරමය) භාවිතා කර ගෙවීම් කළ හැක.

ඔබ නිවාසය හෝ කාමරය මාරු කරන විට විදුලිය විසන්ධි වනු ඇත. එබැවින් කරුණාකර කලින් විදුලි බල මණ්ඩලයට ඔබ නිවාස මාරු කරන බව දැනුම් දෙන්න.

◇ගෑස්

ජපානයේ නාගරික ගෑස් වායුව සහ ප්‍රොපේන් ගෑස් වායුව ලෙස වර්ග දෙකක් තිබේ: ගෑස් වර්ගයට ගැලපෙන ගෑස් උපකරණ භාවිතා කිරීම අවශ්‍ය වේ. ගෑස්

があります。ガスの種類に合わないガス器具を使用すると、火災や不完全燃焼を起こす場合があるので危険です。

වර්ගයට නොගැලපෙන ගෑස් උපකරණ භාවිතා කිරීමෙන් ගින්නක් හෝ අසම්පූර්ණ දහනයක් ඇති විය හැකි නිසා එය අනතුරුදායක ය.

・都市ガス

都市ガスを使い始めるときは、事前に近くのガス会社に連絡します。連絡をするとガス会社の係員が来て、ガスの元栓を開き、ガスもれやガス器具の安全点検をします。
ガス料金は銀行口座から毎月自動振込みにするか、振込通知書により銀行、郵便局、コンビニエンスストアなどから支払います。

・නාගරික ගෑස් වායු

ඔබ නාගරික ගෑස් වායුව භාවිතා කිරීම ආරම්භ කරන විට, ඔබට ආසන්නතම දේශීය ගෑස් සමාගම දැනුවත් කරන්න. ඔබේ දැනුම්දීමට අනුව ගෑස් සමාගමේ කාර්ය මණ්ඩලයෙන් පැමිණ ප්‍රධාන ගෑස් කපාටය විවෘත කර, ගෑස් කාන්දුවීම් සහ ගෑස් උපකරණ පරීක්ෂා කර එහි ආරක්ෂාව තහවුරු කරයි.
ගෑස් බිල්පත් ඔබේ බැංකු ගිණුමෙන් මාසිකව ස්වයංක්‍රීය බැංකු හුවමාරුවකින් හෝ ගෙවීම් බිල්පතක් මගින් බැංකුවකින්, තැපැල් කාර්යාලයකින්, කොන්බිනියකින් (පැය 24ම විවෘත වෙලඳසල) ගෙවිය හැක.

・プロパンガス (LP ガス)

賃貸アパートなどによっては、プロパンガスを利用する場合があります。プロパンガスはボンベに入っています。使用時の注意や支払い方法については、家主やアパートの管理会社に問い合わせてください。

・ප්‍රොපේන් ගෑස් වායුව (LP ගෑස්)

සමහර කුලී මහල් නිවාසවල ප්‍රොපේන් වායුව භාවිතා කළ හැක. ප්‍රොපේන් වායුව සිලින්ඩරයක ඇත. ප්‍රොපේන් ගෑස් වායුව මහල් නිවාසය භාවිතා කිරීමේදී සැලිකිලිමත් විය යුතු කරුණු සහ ගාස්තු ගෙවිය යුතු ආකාරය ගැන ඉඩම් හිමියාගෙන් හෝ මහල් නිවාස කළමනාකරණ සමාගමෙන් විමසන්න.

◇水道

日本の水道水は、飲料水としても使用できます。
水道を使い始めるときは、水道を管理している千葉県企業局や居住地の市町村の水道担当課などに連絡します。
水道料金は銀行口座の自動振込にするか納入通知書(振込み用連絡用紙)にて、コンビニエンスストアまたは、金融機関等で支払います。引越しをするときは千葉県企業局や居住地の市町村の水道担当課などに連絡し、水道料金を精算します。
詳しいことは、千葉県企業局又は市町村の水道担当課に問い合わせてください。

◇ජලය

ජපානයේ නළ ජලය පානීය ජලය ලෙස භාවිතා කළ හැකිය. ඔබ ජල පරිභෝජනය ආරම්භ කරන විට, නළ ජල සේවාව කළමනාකරණය කරන විබා ප්‍රාන්ත ව්‍යවසාය කාර්යාංශය හෝ ඔබේ මහ නගර සභාවේ ජල සැපයුම් අංශය අමතන්න.
ජල ගාස්තුව බැංකු ගිණුමෙන් ස්වයංක්‍රීයව මුදල් මාරු කිරීමෙන් හෝ ගෙවීම සඳහා සම්බන්ධතා පෝරමය (තැන්පතු පෝරමයක්) මඟින් ඔබගේ පහසුව සඳහා කොන්බිනියකින් හෝ මූල්‍ය ආයතනයකින් ගෙවිය හැකිය.. නිවෙස් මාරු කරන අවස්ථාවේදී විබා ප්‍රාන්ත පොදු ව්‍යවසාය කාර්යාංශය හෝ ඔබ ජීවත් වන ප්‍රදේශයේ ජල සම්පාදන දෙපාර්තමේන්තුව අමතා ජල බිල්පත් ගෙවා අවසන් කරන්න.
වැඩි විස්තර සඳහා, විබා ප්‍රාන්ත ව්‍යවසාය කාර්යාංශය හෝ නාගරික කාර්යාලයේ ජල සැපයුම් අංශය අමතන්න.

・県水お客様センター(千葉県企業局)

電話:0570-001245
月～金:8:45am～6:00pm
土曜日:8:45am～5:00pm

・චිබා පොදු ව්‍යවසාය කාර්යාංශයේ පාරිභෝගික මධ්‍යස්ථානය

දුරකතන: 0570-001245
සඳුදා සිට සිකුරාදා දක්වා: පෙ.ව. 8:45 - ප.ව. 6:00
සෙනසුරාදා: පෙ.ව. 8:45 - ප.ව. 5:00

■ 引越し

引越しをするときには、次のような手続きが必要になります。

■ නිවාස මාරු කිරීම

නිවෙස් මාරු කිරීමේදී පහත සඳහන් ක්‍රියා පටිපාටි වලට අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

①市区町村役所の窓口への届出：中長期在留者の方が、住居地を変更した時は、移転した日から14日以内に在留カードと転出地の市町村から発行された転出証明書を持参の上、移転先の市区町村役所の窓口でその住居地を届けてください。

②国民健康保険の申請：市区町村役所の国民健康保険担当係

③運転免許証の住所変更：転入先の所管警察署又は運転免許センター

④電気：水道・ガス・電話・郵便局：少なくとも転出（引越し日）の2～3日前までに電力会社、ガス会社、水道、NTT（電話）、郵便局などへの連絡が必要です。引越しの当日に各会社の係員がメーターをチェックして精算してくれます。郵便局では新しい住所へ郵便物を転送（1年間）してくれるサービスがあります。

⑤印鑑登録：転出してきた市区町村で申請したものは使えなくなります。

①නගර සභා කාර්යාලය වෙත වෙත දැනුම් දීම: කෙටි කාලීන සහ දීර්ඝ කාලීන පදිංචිකරුවන් පදිංචි ස්ථානය වෙනස් කරන විට, නැවත පදිංචි වන දින සිට දින 14ක් ඇතුළත ඔබේ පදිංචි කාඩ්පත සහ මහ නගර සභාව විසින් නිකුත් කරන ලද පෙර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය රැගෙන ගොස් ඔබ පදිංචියට යන නගරයේ නගර සභා කාර්යාලයේ නාගරික කාර්යාල කවුළුව වෙත ඉදිරිපත් කරන්න.

②ජාතික සෞඛ්‍ය රක්ෂණය සඳහා අයදුම් කිරීම: ඔබ අයත් වන නගර සභා කාර්යාලයේ ජාතික සෞඛ්‍ය රක්ෂණ අංශය

③රියදුරු බලපත්‍රයේ ලිපිනය වෙනස් කිරීම: නව ලිපිනය අයත් බල ප්‍රදේශය යටතේ ඇති අධිකරණ බලය සහිත පොලිස් ස්ථානයේ රියදුරු බලපත්‍ර මධ්‍යස්ථානය

④විදුලිය: ජල සැපයුම, ගෑස්, දුරකථන, තැපැල් කාර්යාලය: අවම වශයෙන් නිවෙස් මාරු කරන දින දෙක තුනකට පෙර විදුලි බල සමාගම, ගෑස් සමාගම, ජල සැපයුම් සමාගම, NTT (දුරකථන), තැපැල් කාර්යාලය ආදිය දැනුවත් කරන්න. නිවෙස භාර දෙන දිනයේදී එක් එක් සමාගමේ සේවකයන් විසින් මීටරය පරීක්ෂා කර බිල් පත් සකසා දෙනු ලැබේ. තැපැල් කාර්යාලයෙන් ඔබේ නමට ලැබෙන තැපැල් භාණ්ඩ නව ලිපිනයට (වසරකට) යොමු කිරීමේ සේවාවක් ඇත.

⑤මුද්‍රා ලියාපදිංචිය: ඔබ පැරණි පදිංචි ස්ථානයේ ලියාපදිංචි කළ මුද්‍රාව අවලංගු වනු ඇත.

8 暮らし | එදිනෙදා ජීවිතය

■日本の祝日 ■ ජපානයේ නිවාඩු දින

日本の祝日

ජපානයේ රජයේ නිවාඩු

日付 දිනය	日本語 ජපන් භාෂාව	ローマ字 රෝමානු අක්ෂර	シンハラ語 සිංහල භාෂාව
1 月 1 日	元日	Ganjitsu	අලුත් අවුරුදු දිනය
1 月の第 2 月曜日	成人の日	Seijin no hi	වැඩිහිටියන් බවට පත් වීමේ දිනය
2 月 11 日	建国記念の日	Kenkokukinen no hi	ජාතික පදනම් දිනය
2 月 23 日	天皇誕生日	Tennou tanjyoubi	අධිරාජ්‍යයාගේ උපන් දිනය
3 月 21 日*	春分の日*	Shunbun no hi	වසන්ත විෂුව දිනය*
4 月 29 日	昭和の日	Shouwa no hi	ෂෝවා දිනය
5 月 3 日	憲法記念日	Kenpou kinenbi	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුස්මරණ දිනය
5 月 4 日	みどりの日	Midori no hi	හරිත දිනය
5 月 5 日	こどもの日	Kodomo no hi	ළමා දිනය
7 月の第3月曜日	海の日	Umi no hi	නාවික දිනය
8 月 11 日	山の日	Yamano hi	කඳුකර දිනය
9 月の第3月曜日	敬老の日	Keirou no hi	වැඩිහිටි දිනය
9 月 23 日*	秋分の日*	Shubun no hi	සරත් විෂුව දිනය*
10 月の第2月曜日	スポーツの日	Supotsu no hi	සෞඛ්‍ය හා ක්‍රීඩා දිනය
11 月 3 日	文化の日	Bunka no hi	සංස්කෘතික දිනය
11 月 23 日	勤労感謝の日	Kinroukansha no hi	කම්කරු දිනය

* *のついた祝日は、年によって日付が変わります。

* ලෙස සලකුණු කර* ඇති රජයේ නිවාඩු දිනයන් වාර්ශිකවවෙනස් විය හැක.

■ 覚えておくと便利なミニ情報

- あいさつ:近所や職場で知っている人と会ったときには、朝は「おはよう(ございます)」、日中は「こんにちは」、夜は「こんばんは」と言いながら会釈します。
- 食事のとき:食べ始める際に「いただきます」、食べ終わった際には「ごちそうさま」と言います。
- 日本の家屋:通常、玄関が部屋より一段低くなっています。家の中に入るときは、玄関で靴を脱いで上がります。室内用スリッパがある場合は履きますが、畳の部屋ではスリッパは脱ぎます。
- 手洗い(トイレ):洋式と和式のトイレがあります。和式トイレは、便器の上にしゃがんで用を足します

■අත්‍යවශ්‍ය තොරතුරු

- ආචාර විධි: අසල්වැසියෙකු හෝ රැකියා ස්ථානයේ දන්නා පුද්ගලයෙකු මුණ ගැසුණු විට, උදෑසන කාලයේදී "ඔහයෝ(ගොසයිමස්)", දිවා කාලයේ දී "කොන්නිච්චා" ,රාත්‍රියේදී "කොන්බන්වා" ලෙස පවසමින් හිස නම ආචාර කරයි.
- ආහාර ගැනීමේදී: ආහාර ගැනීමට පෙර ‘‘ඉතදකිමසස්’’ ලෙසත්, ආහාර ගැනීමෙන් පසුව ‘‘ගොච්සෝසම’’ ලෙසත් පවසයි.
- ජපන් නිවාස: සාමාන්‍යයෙන් ජපන් නිවාසයක ඇතුලු වීමේ ප්‍රධාන දොරටුව කාමර වලට වඩා එක් පඩියක් පහළින් පිහිටා තිබේ. නිවසකට ඇතුලු වීමේදී සාමන්‍යයෙන් ප්‍රධාන දොරටුව අසලදී පාවහන් ගලවා නිවසට ඇතුලු වේ. කාමර තුළ භාවිත කළ හැකි පාවහන් තබා ඇති නම් ඒවා පැළඳිය හැකිය.නමුත් තනම් එළා ඇති නිවසක නම් පාවහන් පළඳින්නේ නැත.
- විවේක කාමර(වැසිකිළිය): සාම්ප්‍රදායික ජපන් පන්නයේ වැසිකිළි වර්ග සහ බටහිර පන්නයේ වැසිකිළි වර්ග ජපානය තුළ දැකිය හැකිය. ජපන්

す。トイレットペーパー以外の物を便器に捨てると詰まりますので注意してください。

•風呂：日本式の風呂では、浴槽の外で体を洗ってから、浴槽につかります。湯は1人入るごとに替えないので、後から入る人のために、きれいに使いましょう。

•チップ：日本ではチップを渡す習慣はありません。

•レストランやホテルなどでは、請求料金にサービス料が含まれていることがあります。

•自治会（町内会）と子供会：地域の住民の助け合いや親睦の場として町内ごとに組織されています。入会は任意ですが、入会すると自治体の広報や地域の行事の情報を得ることができます。清掃活動、防犯活動、防災活動、盆踊りや運動会などの行事も行っています。お知らせは、通常、「回覧板」で回ってきますので、読んだら順番に次の人に回します。

පන්නයේ වැසිකිළියක් භාවිතා කරන විට, වැසිකිළි බඳුනට උඩින් උක්කුටියෙන් වාඩි වී තම කාර්යය ඉටු කරගන්න. ඔබ වැසිකිලි කඩදාසි හැර වෙනත් දෙයක් වැසිකිළි බඳුනට විසි කළහොත් අවහිරයක් සිදු විය හැකි බැවින් එසේ නොකිරීමට වග බලා ගන්න.

•නාන තටාකය(ෆුරෝ): ජපන් පන්නයේ නාන තටාකයකට ඇතුලු වීමට පෙර නාන තටාකයෙන් පිටත දී ඔබේ සිරුර සෝදාගත යුතුය.නාන තටාකයට ඇතුළු වන සෑම පුද්ගලයෙකුගෙන් පුද්ගලයෙකුටම තටාකයේ ඇති උණුසුම් ජලය මාරු නොකරන බැවින් පසුව ඇතුළු වන අය එය පිරිසිදුව භාවිතා කරන්න.

•සන්තෝසම: ජපානයේ සන්තෝසමක් (ටිප් එකක්) ලෙස මුදල ලබා දීමේ සිරිතක් නොමැත.

•ආපනශාලා සහ හෝටල්වලදී, සේවා ගාස්තු එම බිල්පත්වලට ඇතුළත් ව තිබිය හැකිය.

•ප්‍රජා සංගම් (අසල්වැසි සංගම්) සහ ළමා සංගම්: ප්‍රදේශවාසීන් අතර මිත්‍රශීලීත්වය සහ සහයෝගීතාවය උදෙසා සෑම නගරයකම සංසදයක් පිහිටුවා ඇත. එහි සාමාජිකත්වය ලබා ගැනීම ස්වේච්ඡාවෙන් සිදු වේ. නමුත් ඔබ සාමාජිකයෙකු වූ පසු, ඔබට පළාත් පාලන ප්‍රචාරණ සහ ප්‍රාදේශීය සිදුවීම් පිළිබඳ තොරතුරුලබා ගැනීමේ හැකියාව හැක. පිරිසිදු කිරීමේ කටයුතු, අපරාධ වැළැක්වීමේ කටයුතු, ආපදා වැළැක්වීමේ කටයුතු, බොන් ඔදොරි නම් වූ නැටුම් සහ ක්‍රීඩා උත්සව වැනි ඉසව්ද මෙම සංගම් මගින් පවත්වයි. සාමාන්‍යයෙන් නිවේදන "සංචරණ පුවරුවක්" යොදාගනිමින් බෙදා හරිනු ලැබේ. එබැවින් කියවීමෙන් පසු ඊළඟ පුද්ගලයා වෙත යොමු කරනු ලැබේ.

■ ゴミの処理

家庭から出るゴミは、通常、燃えるゴミ、燃えないゴミ、ビン・缶、資源物など市町村で決められた種類に分別し、決められた日時に、決められた場所に出します。粗大ゴミや処理が難しいゴミは、有料で個別に処理します。エアコン、テレビ、冷蔵庫、洗濯機の4品目は、粗大ゴミにして出すことができませんので、購入した販売店に有料で引き取ってもらいます。

ゴミの分け方や出し方は、地域ごとに決められていますので、近所の人に確認するか、市区町村役所に問い合わせてパンフレットなどをもらってください。

■අපද්‍රව්‍ය කලමණාකරණය

නිවෙස් වලින් ඉවත දමන කසළ සාමාන්‍යයෙන් දහනය කළ හැකි, දහනය කළ නොහැකි, බෝතල්, කෑන්, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය යනාදිය ලෙස නගර සභාව විසින් තීරණය කරනු ලබන කාණ්ඩවලට වර්ග කර, නියමිත දිනයක සහ වේලාවක නියමිත ස්ථානයක තබනු ලැබේ. විශාල කසළ සහ බැහැර කිරීමට අපහසු කසළ සඳහා ගාස්තුවක් ගෙවා වෙන වෙනම බැහැර කළ යුතුයි. වායු සමීකරණ, රූපවාහිනී, ශීතකරණ සහ රෙදි සෝදන යන්ත්‍ර වැනි විශාල ප්‍රමාණයේ භාණ්ඩ වර්ග 4 කසළ ලෙස බැහැර කළ නොහැක. ඒවා ඔබ භාණ්ඩය මිලදී ගත් වෙළඳසැලට ගාස්තුවක් ගෙවා ලබා දිය හැක.

කසළ වර්ග කිරීම සහ බැහැර කිරීම එක් එක් කලාපය අනුව තීරණය වේ. එබැවින් ඒ සම්බන්ධව කරුණාකර ඔබේ අසල්වැසියන් ගෙන් අසා දැන ගන්න. එසේත් නොමැති නම් නාගරික කාර්යාලය අමතා පත්‍රිකාවක් ඉල්ලා ගන්න.

役に立つ言葉

ප්‍රයෝජනවත් වීය හැකි වචන

日本語 ජපන් භාෂාව	ローマ字 රෝමානු අක්ෂර	シンハラ語 සිංහල භාෂාව
ゴミの置き場はどこですか？	Gomi okiba wa doko desu ka?	කසල තබන ස්ථානය කොහෙද?
ゴミを出す日、時間を教えてください。	Gomi wo dasu hi to jikan wo oshiete kudasai.	කරුණාකර කසල දැමිය යුතු දිනයන් සහ වේලාවන් කියන්න.
ゴミの分け方を教えてください。	Gomi no wakekata wo oshiete kudasai.	කරුණාකර කසල වෙන් කරන ආකාරය කියලා දෙන්න.
ゴミ袋はどこに売っていますか？	Gomibukuro wa doko ni utte imasu ka?	කසල දමන මලු මිලදී ගන්නේ කොහෙන්ද?
役所の電話番号は何番ですか？	Yakusho no denwa bango wa nanban desu ka?	නගර සභා කාර්යාලයේ දුරකතන අංකය කුමක්ද?

■ ペットを飼うとき

◇犬の登録及び予防接種

犬を飼うときは、登録と狂犬病の予防注射が義務付けられています。生後91日以上の飼い犬を所有したときは、30日以内に市町村の役所で犬の登録を申請します。また、犬が死亡したり、所在地を変更したり、犬の所有者を変更したりした場合も 30日以内に申請します。登録をすると「鑑札」が交付されますので、それを必ず犬につけます。毎年1回、狂犬病の予防注射を受けさせなければなりません（4月～6月）。注射後、市町村の役所で手続きすると狂犬病予防注射済票が交付されますので、それを必ず犬につけます。
詳しくは市町村役所にお問い合わせください。

◇犬や猫が飼えなくなったとき・死んだとき

犬や猫を飼い続けることが困難になった場合には、できるかぎり新しい飼い主を見つけてください。どうしても新しい飼い主が見つからないときは、地域の保健所か動物愛護センターに相談してください。ペットが死んだときは、最寄の清掃事務所又はペット霊園に相談してください。

・動物愛護センター
富里市御料709-1
電話：0476-93-5711

・動物愛護センター（東葛飾支所）
柏市高柳1018-6
電話：04-7191-0050

■සුරතල් සතුන් ඇති කිරීම

◇සුනඛයින් ලියාපදිංචි කිරීම සහ එන්නත් කිරීම

ඔබ සුරතල් සුනඛයෙකු ඇති කරන්නේ නම් සුනඛයාව ලියාපදිංචි කර ජලභීතිකා එන්නත ලබාදිය යුතුය. උපතින් පසු දින 91 හෝ ඊට වැඩි සුනඛයෙකු හාරව සිටී නම්, දින 30ක් ඇතුළත ඔබ නාගරික කාර්යාලයේ සුනඛ ලියාපදිංචිය සඳහා අයදුම් කරන්න. ඊට අමතරව සුනඛයා මිය ගිය විට, ලිපිනය වෙනස් වූ විට, එසේත් නැතිනම් සුනඛයාගේ හාරකාරයා වෙනස් වූ විට දින 30ක් ඇතුලත සුනඛ ලියාපදිංචිය සඳහා අයදුම් කරන්න. ලියාපදිංචි වූ විට, ඔබට "බලපත්‍රයක්" නිකුත් කරනු ඇත. එබැවින් එය ඔබේ සුනඛයාට අමුණන්න. ඔබේ සුරතලාට වසරකට වරක් ජලභීතිකා රෝග නිවාරණ එන්නත ලබා දිය යුතුය (අප්‍රේල් සිට ජූනි දක්වා) .
එන්නත ලබා දීමෙන් පසු, ඔබේ ප්‍රදේශයේ කාර්යාලයෙන් ජලභීතිකා එන්නත් ටැගයක් නිකුත් කරනු ලබන අතර එය ඔබේ බල්ලාට සවි කළ යුතුය.
විස්තර සඳහා කරුණාකර නාගරික කාර්යාලය අමතන්න.

◇සුනඛයෙකු හෝ බළලෙකු තවදුරටත් රැක බලා ගැනීමට නොහැකි වූ විට හෝ මියගිය විට

සුනඛයෙකු හෝ බළලෙකු ඇති කිරීම අපහසු වූ විට හැකි පමණ සුරතලාට නව ස්වාමියෙකු සොයා දීමට කටයුතු කරන්න. ඔබට නව හිමිකරුවෙකු සොයාගත නොහැකි නම්, ඔබේ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානය හෝ සත්ව සුභසාධන මධ්‍යස්ථානය සමඟ සාකච්ඡා කරන්න. ඔබේ සුරතලා මිය ගිය විට, ළඟම ඇති පිරිසිදු කිරීමේ කාර්යාලය හෝ සුරතල් සුසාන භූමිය ට දැනුම් දෙන්න.

・සත්ව සුභසාධන මධ්‍යස්ථානය
Tomisato-shi, Goryo 709-1
දුරකතන: 0476-93-5711

・සත්ව සුභසාධන මධ්‍යස්ථානය (ශාඛා කාර්යාලය නිගශිකත්සුශික)
Kashiwa-shi, Takayanagi 1018-6
දුරකතන: 04-7191-0050

・千葉市動物保護指導センター
（千葉市に住んでいる方）
千葉市稲毛区宮野木町445番地1
電話：043-258-7817

・船橋市動物愛護指導センター
（船橋市に住んでいる方）
船橋市潮見町32-2
電話：047-435-3916

・柏市動物愛護ふれあいセンター
（柏市に住んでいる方）
柏市風早2丁目4-3
電話：04-7190-2828

◇その他
集合住宅の中には、ペットの飼育を禁止しているところがあります。集合住宅でペットを飼うときは、賃貸借契約書を事前に確認してください。
事故を防ぐために、犬は囲いの中で飼うか、ロープなどにつないで飼わなければいけません。

■ 物を買ったり、サービスを受けて、トラブルにあったとき

消費者相談窓口では、身近な商品の品質やサービスなど消費生活に関する相談、悪質商法や契約のトラブルにあったときの相談を受け付けています。

◇千葉県消費者センター
電話：047-434-0999
相談時間：月曜日～金曜日（祝祭日を除く）
午前9:00～午後4:30
土曜日　午前9:00～午後4:00
（祝日・年末年始を除く）
http://www.pref.chiba.lg.jp/customer/soudan/chiba.html

・国民生活センター
http://www.kokusen.go.jp/ncac_index_e.html
（英語）

・චිබා නගර සත්ව ආරක්ෂණ මාර්ගෝපදේශ මධ්‍යස්ථානය (චිබා නගරයේ ජීවත් වන පුද්ගලයන් සඳහා)
Chiba-shi,Inage-ku,Miyanogi-Chou,445-1
දුරකතන: 043-258-7817

・ෆුනබෂි නගර සත්ව සුභසාධන මාර්ගෝපදේශ මධ්‍යස්ථානය(ෆුනබෂි නගරයේ ජීවත් වන පුද්ගලයන් සඳහා)
Funabashi-shi, Shiomi-Chou,32-2
දුරකතන: 047-435-3916

・කෂිවා නගර සත්ව සුභසාධනය සහ අන්තර්ක්‍රියා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය (කෂිවා නගරයේ ජීවත් වන පුද්ගලයන් සඳහා)
Kashiwa-shi, Kazahaya, 2-4-3
දුරකතන: 04-7190-2828

◇වෙනත්
සමහර නිවාස සංකීර්ණවල සුරතල් සතුන් ඇති කිරීම තහනම් කර ඇත. ඔබට නිවාස සංකීර්ණයක සුරතල් සතෙකු තබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර කුලී කොන්ත්‍රාත්තුව කල්තියා පරීක්ෂා කර බලන්න.
අනතුරු වළක්වා ගැනීම සඳහා, බල්ලන් කූඩුවක හෝ පටියක බැඳ තබා ගත යුතුය.

■ භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමකදී යම් ගැටලුවකට මුහුණ දුන් අවස්ථාවක

පාරිභෝගික උපදේශන ස්ථානයේදී, ඔබට හුරුපුරුදු නිෂ්පාදන සහ සේවාවන්හි ගුණාත්මකභාවය වැනි පාරිභෝගික ජීවන රටාවන් සම්බන්ධ උපදේශනය සහ ව්‍යාපාරයේ හෝ ගිවිසුම් සමඟ ගැටලු ඇති විට උපදේශන සේවාව ලබා දේ.

◇චිබා ප්‍රාන්ත පාරිභෝගික සේවා මධ්‍යස්ථානය
දුරකතන: 047-434-0999
රාජකාරී වේලාවන්: සදුදා- සිකුරාදා (පොදු නිවාඩු දින හැර)
පෙ.ව. 9:00 - ප.ව. 4:30
සෙනසුරාදා පෙ.ව. 9:00 – ප.ව. 4:00
(නිවාඩු සහ වසර අවසාන සහ අලුත් අවුරුදු නිවාඩු හැර)
http://www.pref.chiba.lg.jp/customer/soudan/chiba.html

・ජපානයේ ජාතික පාරිභෝගික කටයුතු මධ්‍යස්ථානය
http://www.kokusen.go.jp/ncac_index_e.html
（ඉංග්‍රීසි භාෂාව）

市町村消費生活センター

නාගරික පාරිභෝගික මධ්‍යස්ථාන

地域 පිහිටීම	電話 දුරකතන අංකය	相談時間 උපදේශන සේවා සපයන වේලාවන්
千葉 (Chiba)	043-207-3000	පෙ.ව. 9:00 - ප.ව. 4:30 (සෙනසුරාදා දිනයේද විවෘතව ඇති නමුත් දුරකතන මාර්ගයෙන් පමණි)
習志野 (Narashino)	047-451-6999	පෙ.ව. 9:30 - ප.ව. 4:00 (දෙවන සෙනසුරාදා දිනයේදී විවෘතව ඇත)
八千代 (Yachiyo)	047-485-0559	පෙ.ව. 9:00 - ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව. 4:00
市川 (Ichikawa)	047-712-8629	පෙ.ව. 10:00 - ප.ව. 4:00 (මාසයේ දෙවන සහ හතරවන සෙනසුරාදා දින වල විවෘතව ඇත දුරකතන මාර්ගයෙන් පමණකි)
船橋 (Funabashi)	047-423-3006	පෙ.ව. 9:00 - ප.ව. 4:00 (මාසයේ දෙවන සහ හතරවන සෙනසුරාදා දින වල විවෘතව ඇත)
浦安 (Urayasu)	047-390-0030	පෙ.ව. 10:00 - ප.ව. 4:00
松戸 (Matsudo)	047-365-6565	පෙ.ව. 8:30 - ප.ව. 4:00
流山 (Nagareyama)	04-7158-0999	පෙ.ව. 9:00 - ප.ව. 4:30
鎌ケ谷（Kamagaya）	047-445-1246	පෙ.ව. 10:00 - ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව. 4:00
野田 (Noda)	04-7123-1084	පෙ.ව. 10:00 - ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව. 4:00
柏 (Kashiwa)	04-7164-4100	පෙ.ව. 9:00 - ප.ව.4:30 (සඳුදා-සිකුරාදා) පෙ.ව 9:00 - ප.ව. 4:30 (තුන්වෙනි සෙනසුරාදා දුරකතන මාර්ගයෙන් පමණකි)
我孫子 (Abiko)	04-7185-0999	පෙ.ව. 10:00 - ප.ව.5:30 (මාසයේ දෙවන සහ හතරවන සෙනසුරාදා දින වල විවෘතව ඇත)
成田 (Narita)	0476-23-1161	පෙ.ව. 9:00 - ප.ව.4:30
佐倉 (Sakura)	043-483-4999	පෙ.ව. 9:00 - ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව. 4:00
四街道 (Yotsukaido)	043-422-2155	පෙ.ව. 9:00 - ප.ව.4:00
八街 (Yachimata)	043-443-9299	පෙ.ව. 9:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
印西（Inzai）	0476-42-3306	පෙ.ව. 9:30 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:30
白井（Shiroi）	047-492-1111 (3202)	පෙ.ව. 10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
富里 (Tomisato)	0476-93-5348	පෙ.ව. 9:30 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
香取（Katori）	0478-50-1300	පෙ.ව. 9:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
銚子 (Choshi)	0479-24-8194	පෙ.ව. 9:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
旭 (Asahi)	0479-62-8019	පෙ.ව. 9:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
匝瑳 (Sosa)	0479-74-7007	පෙ.ව. 9:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00 (සඳුදා, අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා)
東金 (Togane)	0475-50-1238	පෙ.ව. 10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00
山武 (Sanmu)	0475-82-8453	පෙ.ව. 9:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:30
大網白里 (Oamishirasato)	0475-70-0344	පෙ.ව. 10:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00 (සඳුදා, අඟහරුවාදා, බදාදා, සිකුරාදා)
茂原 (Mobara)	0475-20-1101	පෙ.ව. 9:30 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.4:00
木更津 (Kisarazu)	0438-20-2234	පෙ.ව. 10:00 - ප.ව.4:00

地域 පිහිටීම	電話 දුරකතන අංකය	相談時間 උපදේශන සේවා සපයන වේලාවන්
君津（Kimitsu）	0439-56-1529	පෙ.ව. 9:00 - ප.ව.12:00, ප.ව.1:00 - ප.ව.3:00 (සඳුදා, බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා)
袖ケ浦（Sodegaura）	0438-62-3134	පෙ.ව. 9:00 - ප.ව.12:00pm, ප.ව.1:00 - ප.ව.4:00
市原（Ichihara）	0436-21-0999	පෙ.ව. 9:00 - ප.ව.12:00pm, ප.ව.1:00 - ප.ව.3:30

*相談は日本語です。
営業日は通常月曜日から金曜日です。施設が追加の曜日に営業している場合は、「相談時間」欄に記載されています。

* උපදේශන සේවා ජපන් භාෂාවෙනි.
රාජකාරි දින සාමාන්‍යයෙන් සඳුදා සිට සිකුරාදා දක්වා වේ. කාර්යාලය සතියේ අමතර දිනවල විවෘතව පවතී නම්, අමතර දින "උපදේශන වේලාවන්" තීරුවේ සටහන් කරනු ඇත.

■ 銀行で口座を開設するとき

口座開設の申込みには、パスポートや在留カードなどの本人が確認できる書類などと、印鑑またはサイン、社員証又は学生証が必要です。同時に、キャッシュカードをつくると、ATM(現金自動預払機)やCD(現金自動払機)で入金・払い戻し・振込・残高照会をすることができて便利です。

帰国するときは、解約しましょう。

■බැංකු ගිණුමක් විවෘත කිරීම

බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා අයදුම් කිරීමේදී විදේශ ගමන් බලපත්‍රය සහ පදිංචි කාඩ්පත වැනි අදාල පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි ලියකියවිලි සහ මුද්‍රාවක්, අත්සනක් සහ සේවක හැඳුනුම්පතක් හෝ ශිෂ්‍ය හැඳුනුම්පතක් අවශ්‍ය වේ. ඒ අතරම, ඔබ බැංකු කාඩ්පතක් නිර්මාණය කරන්නේ නම්, ATM (ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර) සහ සීඩී (ස්වයංක්‍රීය මුදල් යන්ත්‍ර) මාර්ගයෙන් පහසුවෙන් මුදල් තැන්පතු, මුදල් ආපසු ගෙවීම්, මුදල් ගිණුම් හරහා හුවමාරු කිරීම් සහ ශේෂයන් පරීක්ෂා කිරීම් කළ හැකිය.
ඔබ ඔබේ මව් රටට ආපසු යන විට ඔබේ ගිණුම අවලංගු කරන්න.

■ 公共料金の支払

電気、ガス、水道、電話、NHKなどの料金は、毎月決まった日までに、それぞれの会社に納入しなければなりません。銀行などの金融機関に普通預金の口座を持っている人は、その口座からこれらの料金を期日までに自動的に払ってくれる口座振替制度を利用すると便利です。
現金での支払いのほか、コンビニエンスストアやクレジットカードでも支払えます。

■බිල්පත් ගෙවීම්

විදුලිය, ගෑස්, ජලය, දුරකථන, NHK යනාදී ගාස්තු සෑම මාසයකම නියමිත දිනට එක් එක් සමාගමට ගෙවිය යුතුය. බැංකුවක් වැනි මූල්‍ය ආයතනයක සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් ඇති අයෙකුට නියමිත දිනට මෙම ගාස්තු ස්වයංක්‍රීයව තම ගිණුම හරහා ඉතා පහසුවෙන් ගෙවිය හැකිය.

බිල්පත් ගෙවීම මුදල් වලට අමතරව,වෙළඳසැල්වලින් හෝ ක්‍රෙඩිට් කාඩ් මගින්ද සිදුකළ හැකිය.

■ 新聞

日本では、近くの新聞代理店に申し込むと、毎日、朝と夕方に配達をしてもらえます。
何種類かの外国語の新聞もありますので、近くの新聞代理店に問い合わせてください。

■ පුවත්පත්

ජපානයේ, ඔබට ආසන්න පුවත්පත් ආයතනයකින් අයදුම් කළහොත්, ඔබට සෑම දිනකම උදෑසන සහ සවස පුවත්පත් පිටපතක් ලැබෙනු ඇත. විදේශීය භාෂා පුවත්පත් වර්ග ද කිහිපයක් තිබෙන බැවින් කරුණාකර ලහම ඇති පුවත්පත් ආයතනයෙන් විමසන්න.

■ テレビ・ラジオ

◇テレビ

家やアパートにテレビを取り付けた場合、日本放送協会（NHK）との受信契約が必要になります。NHK は公共の放送局です。受信料は 2 か月ごとに支払うことになっています。6 か月分、12 か月分を前払いすることもできます。銀行口座からの振替、クレジットカードや振込用紙による支払い方法があります。

多くの外国の映画やニュースを含む番組が、原語と日本語で放映されています。TV の多重音声機能により、原語又は日本語に切り替えることができます。

大規模地震の警戒宣言、津波警報が発せられた場合は、NHK（1 チャンネル）、衛星放送TV の副音声で、英語の放送を聞くことができます。

◇ラジオ

千葉県内で聞けるラジオステーションはたくさんありますが、日本のラジオの周波数は他の国と異なり外国のラジオは使用できませんので、日本製のラジオが必要になります。なお、次のステーションで外国語による放送を聞くことができます。

NHK ラジオ第2：AM693kHz

Inter FM：FM 89.7MHz

毎日24時間英語を中心に放送。

■ රූපවාහිනි සහ ගුවන් විදුලිය

◇රූපවාහිනිය

ඔබේ නිවසේ හෝ මහල් නිවාසයේ රූපවාහිනියක් ස්ථාපනය කරන්නේ නම්, ඔබ ජපානයේ විකාශන සංස්ථාව (NHK) සමඟ ගිවිසුමක් අත්සන් කළ යුතුය. NHK යනු පොදු විකාශන මධ්‍යස්ථානයකි. එම ගාස්තුව මාස දෙකකට වරක් ගෙවිය යුතුය. ඔබට අවශ්‍ය මාස 6 ක් හෝ මාස 12 ක් සඳහා ද අත්තිකාරම් ගෙවිය හැකිය. බැංකු ගිණුමක් හරහා මුදල් මාරු කිරීමක් මඟින් හෝ ක්‍රෙඩිට් කාඩ් හෝ බිල්පත් ගෙවීම් පෝරමයක් මඟින් ගෙවීමෙ හැකියාව තිබේ.

ප්‍රවෘත්ති ඇතුළු විදේශීය චිත්‍රපට සහ වැඩසටහන් විශාල ප්‍රමාණයක් එහි මුල් භාෂාවෙන් සහ ජපන් භාෂාවෙන් විකාශනය වේ. රූපවාහිනියේ විවිධ ශ්‍රවණ විශේෂාංග භාවිතයෙන් මුල් භාෂාව ජපන් භාෂාවට මාරු කළ හැක.

මහා පරිමාණ භූමිකම්පා අනතුරු ඇඟවීමක් හෝ සුනාමි අනතුරු ඇඟවීමක් නිකුත් කළ විට, NHK (නාලිකා අංක 1) ඔබට වන්දිකා විකාශන හරහා රූපවාහිනියේ ද්විතීයික ශබ්දයෙන් ඉංග්‍රීසි විකාශනවලට සවන් දිය හැකිය.

◇ ගුවන්විදුලිය

විබා ප්‍රාන්තයේ ඔබට සවන් දිය හැකි ගුවන්විදුලි නාලිකා බොහොමයක් ඇති නමුත් ජපානයේ ගුවන්විදුලි සංඛ්‍යාත වෙනත් රටවලට වඩා වෙනස්ය. විදේශීය රේඩියොවක් හරහා ජපන් ගුවන්විදුලියකට සවන් දිය නොහැකි බැවින් ජපානයේ නිෂ්පාදිත රේඩියෝවක් ඒ සඳහා අවශ්‍ය වේ. පහත ගුවන් විදුලි මධ්‍යස්ථාන හරහා විදේශීය භාෂා විකාශනවලට සවන් දිය හැකිය.

NHK **ගුවන්විදුලිය2**: AM693kHz

Inter FM: FM 89.7MHz

විකාශන ප්‍රධාන වශයෙන් දවසේ පැය 24 පුරාම ඉංග්‍රීසි .

■ 図書館

■ පුස්තකාල

千葉県にある主な図書館

විබා ප්‍රාන්තයේ පිහිටි ප්‍රධාන පුස්තකාල

	名前 නම	英語 ඉංග්‍රීසි භාෂාව	住所・電話 ලිපිනය සහ දුරකතන අංකය
1	千葉県立中央図書館	Chiba Prefectural Central Library	Chiba-shi Chuo-ku Ichiba-cho 11-1 043-222-0116
2	千葉県立西部図書館	Chiba Prefectural West Library	Matsudo-shi Sendabori 657-7 047-385-4133
3	千葉県立東部図書館	Chiba Prefectural East Library	Asahi-shi ha no 349 0479-62-7070
4	千葉市中央図書館	Chiba City Central Library	Chiba-shi Chuo-ku Benten 3-7-7 043-287-3980

	名前 නම	英語 ඉංග්‍රීසි භාෂාව	住所・電話 ලිපිනය සහ දුරකතන අංකය
5	千葉市みやこ図書館	Chiba City Miyako Library	Chiba-shi Chuo-ku Miyako-cho 3-11-3 043-233-8333
6	習志野市立中央図書館	Narashino City Central Library	Narashino-shi Moto-okubo 3-8-19 047-475-3213
7	市川市中央図書館	Ichikawa City Central Library	Ichikawa-shi Onitaka 1-1-4 047-320-3333
8	船橋市中央図書館	Funabashi City Central Library	Funabashi-shi Honcho 4-38-28 047-460-1311
9	船橋市西図書館	Funabashi City West Library	Funabashi-shi Nishifuna 1-20-50 047-431-4385
10	船橋市北図書館	Funabashi City North Library	Funabashi-shi Futawa Higashi 5-26-1 047-448-4899
11	浦安市立中央図書館	Urayasu Central Public Library	Urayasu-shi Nekozane 1-2-1 047-352-4646
12	我孫子市民図書館	Abiko City Library	Abiko-shi Wakamatsu 26-4 04-7184-1110
13	白井市立図書館	Shiroi Public Library	Shiroi-shi Fuku 1148-8 047-492-1122
14	成田市立図書館	Narita Public Library	Narita-shi Akasaka 1-1-3 0476-27-4646
15	佐倉市立志津図書館	Sakura Shizu Public Library	Sakura-shi Nishi Shizu 4-1-2 043-488-0906
16	佐倉市立佐倉南図書館	Sakura South Public Library	Sakura-shi Sannou 2-37-13 043-483-3000
17	八街市立図書館	Yachimata Public Library	Yachimata-shi Yachimata Ho 800-1 043-444-4946
18	印西市立大森図書館	Inzai Omori Public Library	Inzai-shi Omori 2535 0476-42-8686
19	富里市立図書館	Tomisato Public Library	Tomisato-shi Nanae 653 -1 0476-90-4646
20	横芝光町立図書館	Yokoshibahikari Public Library	Yokoshiba-Hikari-machi Miyagawa 11917 0479-84-3311
21	袖ケ浦市立中央図書館	Sodegaura Public Library	Sodegaura-shi Sakado-Ichiba 1393-2 0438-63-4646
22	市原市立中央図書館	Ichihara Municipal Central Library	Ichihara-shi Sarashina 5-1-51 0436-23-4946

千葉県には県立図書館が 3館あり、千葉県に住んでいる人は誰でも利用できます。

චිබා ප්‍රාන්තයේ මහජන පුස්තකාල 77ක්, ප්‍රාන්ත පුස්තකාල 3ක් සහ නාගරික පුස්තකාල 74ක් ඇත. ප්‍රාන්තයේ වෙසෙන ඕනෑම අයෙකුට එම පහසුකම් භාවිතා කළ හැක.

図書館カードの申込みには運転免許証、会社の身分証明書、在留カードなど住所を確認できるものが必要です。
また、県内の全ての市町村に図書館や公民館図書室があります。利用については各市町村立図書館等にお問い合わせください。県内にある図書館は、県立図書館ホームページで確認できます。

http://www.library.pref.chiba.lg.jp/guide/librarylist

■ 観光

千葉県は、以下の公式ウェブサイトで、おすすめの観光スポットやモデルコースの情報などを提供しています。

・ちば観光ナビ（日本語）

https://maruchiba.jp/

・Visit Chiba（英語、繁体字、簡体字、タイ語）

https://www.visitchiba.jp/

පුස්තකාල කාඩ්පතක් සඳහා අයදුම් කිරීමට රියදුරු බලපත්‍රයක්, සමාගම් හැඳුනුම්පතක් හෝ පදිංචි කාඩ්පතක් වැනි ඔබේ ලිපිනය තහවුරු කළ හැකි දෙයක් අවශ්‍ය වේ.
ඊට අමතරව, ප්‍රාන්තයේ සියලුම ප්‍රදේශවල පුස්තකාල සහ ප්‍රජා මධ්‍යස්ථාන පුස්තකාල තිබේ. භාවිතය පිළිබඳ විමසීම් සඳහා, කරුණාකර ඔබේ ප්‍රදේශයේ නාගරික පුස්තකාලය අමතන්න. ඔබට ප්‍රාන්තය තුල පිහිටා ඇති පුස්තකාල පිළිබඳව ප්‍රාන්ත පුස්තකාල වෙබ් අඩවියෙන් පරීක්ෂා කළ හැකිය.

http://www.library.pref.chiba.lg.jp/guide/librarylist

■ සංචාර

චිබා ප්‍රාන්තය පහත නිල වෙබ් අඩවියෙන් නිර්දේශිත සංචාරක ස්ථාන සහ ආදර්ශ පාඨමාලා පිළිබඳ තොරතුරු සපයයි:

・චිබා සංචාරක මාර්ගෝපදේශය

https://maruchiba.jp/

・Visit Chiba（ඉංග්‍රීසි, සම්ප්‍රදායික චීන, සරල කළ චීන, තායි）

https://www.visitchiba.jp/

9 通信と郵便

සන්නිවේදන හා තැපැල් සේවා

■ 郵便

◇国内郵便

①定形郵便物(封書) : 50g まで 110円
(規格 : 長さ 14～23.5cm、幅9～12cm、厚さ 3cm以下。重さ 50g以下)

②定形外郵便物(封書) : 重さ・大きさによって料金が異なります。

③通常はがき 85円、ミニレター85円、往復はがき 170円

④小包郵便(ゆうパック) : 大きさと送り先の地域で料金が異なります。
(規格 : 長さ・幅・厚さの合計が 170cm以内。重さ 25kg以内)

・書籍等を送るときはゆうメールを利用すると安い料金となります。
(規格 : 1kg まで)

・必要なら専用の箱を郵便局で買うこともできます。

⑤速達 : 急ぎのときは速達料金を追加して「速達扱い」にすると早く届けてもらえます。

⑥書留 : 現金・重要な文書・物の郵送は「書留」にすると、万一の場合、損害賠償が受けられます。
郵便局の窓口で申し出ます。

*受取りの印または署名が必要な郵便物や小包が配達されたとき、あなたがいないときは、配達員は、「不在配達の通知」を郵便受けの中に残していきます。郵便局は、その郵便物を7日間保管するので、出向いて受け取るか(身分を証明するものを必ず持っていってください)、あるいは希望配達日を郵便局に知らせて再配達を申し込みます。

◇国際郵便

①通常郵便物
航空便には、手紙、ハガキ、本・雑誌(印刷物)があり、10日～14日程度で配達されます。

■ තැපැල් සේවා

◇දේශීය තැපැල් සේවා

①සම්මත ප්‍රමාණය (තැපැල් ලියුම් කවරය): ග්‍රෑම් 50 දක්වා ජපන් යෙන් 110
(සම්මත ප්‍රමාණය : දිග: සෙන්ටිමීටර 14 - 23.5, පළල සෙන්ටිමීටර 9 - 12, ඝනකම: සෙන්ටිමීටර 3කට අඩු, බර: ග්‍රෑම් 50ට අඩු).

②සම්මත නොවන ප්‍රමාණය (තැපැල් ලියුම් කවරය): බර සහ විශාලත්වයට අනුව තැපැල් ගාස්තු වෙනස් වේ.

③සාමාන්‍ය තැපැල් පත් සඳහා ජපන් යෙන් 85, කුඩා ලියුම් සඳහා ජපන් යෙන් 85, ආපසු එවන තැපැල් පත් සඳහා ජපන් යෙන් 170

④පාර්සල් යැවීම (යූ පැක්): විශාලත්වය සහ යවන ස්ථානය අනුව තැපැල් ගාස්තු වෙනස් වේ.
(සම්මත ප්‍රමාණය : දිග, පළල සහ ඝණකම යන සියල්ලෙහි එකතුව සෙන්ටිමීටර 170 නොඉක්මවිය යුතුය. බර කිලෝග්‍රෑම් 25 තුළ විය යුතුය.)

・පොත් යැවීමේදී "යූ මේරු" සේවාව භාවිත කරන්නේ නම් එය ඉතා ලාභදායී වනු ඇත.
(සම්මත බර ප්‍රමාණය: කිලෝග්‍රෑම් 1 දක්වා)

・අවශ්‍ය නම් ඔබට තැපැල් කාර්යාලයේ විශේෂ පෙට්ටියක් මිලදී ගත හැකිය.

